# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 13,256 — 1962 අගෝස්තු 10 වැනි සිකුරාද — 1962.8.10

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


## I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ආදිය ... ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය ... | 1175 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය ... | 1176 |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය ... | 1176 |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | 1178 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 1180 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහා බැංකුවේ දැන්වීම් ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | 1184 |
| ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 1186 |
| "සුරාබද්ද ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... ... | 1196 |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය

**1962 අංක 322**

අංකය: ඩී. 21/රෙක් ව/128.

**යුද්ධ හමුදාව—නිත්‍ය හට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීම්**

පහත නම් සඳහන් නිලධාරියා 1962 ජූලි මස 20 වැනි දින සිට විශ්‍රාම ගනී —

කපිතාන් පිලිප් ආතර් තියඩෝර් කෙලි, ල. කා. හ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කියු. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1962 ජූලි 19 වෙනිදා,
කොළඹ දී ය.

8-470

**1962 අංක 323**

අංකය: ඩී. 21/රෙක් ව/130.

**යුද්ධ හමුදාව—නිත්‍ය හට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද අධිකාරපත්‍ර ලත් ධුරයෙන් ඉල්ලා අස්වීමක්**

1962 ජූලි 31 වැනි දින සිට අධිකාරපත්‍ර ලත් ධුරයෙන් ඉල්ලා අස්වීම

ලුතිනන් ඉලන් කයර් උරුත් තිරන්, ල. වි. යා. ඉ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. කියු. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදෙශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1962 අගෝස්තු මස 2 වැනි දින,
කොළඹ දීය.

8-455

### විශෙෂ නිවේදනයයි

1962 අගෝස්තු මස 14 වෙනි අඟහරුවාද ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1962 අගෝස්තු 17 වැනි දින නිකුත් කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1962 අගෝස්තු 11 වැනි සෙනසුරාද දවල් 12ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1962 අගෝස්තු 3 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

1962 අංක 324

අංකය : ඕ/පීඑජ්/42.

## යුධ හමුදුව—ලංකා ස්වේච්ඡා භට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද අධිකාරි පත්‍ර ලත් ධුරයකින් ඉල්ලා අස්වීමක්

1962 අගෝස්තු මස 1 වැනි දින සිට අධිකාරි පත්‍ර ලත් ධුරයකින් ඉල්ලා අස්වීමක්.

උප ලුතිනන් ඩබ්ලිව්. එම්. ඩී. ජී. විජේරත්න, ලංකා ජාතික ආරක්ෂක බලකාය.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,
ඇන්. කෑ. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1962 අගෝස්තු මස 3 වැනි දින,
කොළඹදී ය.

8-457

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

1962 අංක 325

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පහත සඳහන් පත්කිරීම් කරන ලෙස නියමකර ඇත්තේ ය :—

ඒ. 48/62.

1962 ජූලි මස 6 වැනි දින සිට ජාතික නිවාස කොමසාරිස් සිවිල් සේවක කේ. ඇම්. සී. ජයනෙත්ති මහතා දිවයිනෙන් බැහැරව සිටින කාලය තුල හෝ නැවත නියමයක් කරන තුරු ආණ්ඩුවේ නගර නිර්මාණ ශිල්පී ඇන්. එච්. ද ඇස්. ඒ. ගුණරත්න මහතා සවකීය රාජකාරිවලට අතිරේකව ජාතික නිවාස කොමසාරිස් වශයෙන් තාවකාලිකව රාජකාරියන්හි යෙදීමට.

ඒ. 188/62.

1962 ජූනි මස 25 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සිවිල් සේවක ඩී. ආර්. ඇල්. බාලසූරිය මහතා ධීවර අධ්‍යක්ෂක වශයෙන් වැඩ බැලීමට.

ඒ. 113/59.

1960 මැයි මස 20 වැනි දින සිට ඩබ්ලිව්. ජේ. ප්‍රනාන්දු මහතා සවදේශීය වෛද්‍ය ක්‍රම සංවර්ධන කොමසාරිස් වශයෙන්.

ඒ. 183/62.

1961 ඔක්තෝබර් මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සිවිල් සේවක ඩී. සී. ඇල්. අමරසිංහ මහතා සංවර්ධන අධ්‍යක්ෂක වශයෙන් වැඩ බැලීමට.

ඒ. 184/62.

1962 මැයි මස 16 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ සහකාර අලෙවි කිරීම් සංවර්ධන කොමසාරිස් ඒ. ඩබ්ලිව්. ආර්. පෙරේරා මහතා සවකීය රාජකාරිවලට අතිරේකව එම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අලෙවි කිරීම් සංවර්ධන කොමසාරිස් තනතුරේ තාවකාලිකව වැඩ බැලීමට.

ඒ. 183/62.

1961 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1961 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය තුල සිවිල් සේවක සී. අබේසේකර මහතා නියෝජ්‍ය සංවර්ධන අධ්‍යක්ෂක වශයෙන් වැඩ බැලීමට.

ඒ. 183/62.

1962 ජනවාරි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සිවිල් සේවක ඒ. අයි. මොහිදීන් මහතා නියෝජ්‍ය සංවර්ධන අධ්‍යක්ෂක වශයෙන් වැඩ බැලීමට.

ඒ. 89/62

1962 ජූලි මස 2 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු පලාත් පාලන දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් (මූලස්ථානය) ඩී. රාජේන්ද්‍රා මහතා එම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස් ලෙස වැඩ බැලීමට.

ඒ. 171/62

1962 ජූනි මස 6 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක වී. ජී. හේරත් මහතා එම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂක ලෙස වැඩ බැලීමට.

ඒ. 193/62

1962 ජූනි මස 25 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සිවිල් සේවක බී. ටී. ටී. ඒ. ද ෆොන්සේකා මහතා සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහකාර ලේකම් ලෙස වැඩ බැලීමට.

ඒ. 74/59

1962 අප්‍රේල් මස 1 වැනි දින සිට ආධුනික සහකාර පොලිස් අධිකාරි අයි. කුණරත්නම් මහතා සහකාර පොලිස් අධිකාරිවර යෙකු වශයෙන්.

ඒ. 29/62

1961 දෙසැම්බර් මස 18 වැනි දින සිට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සහකාර තක්සේරුකරු ඒ. එම්. ජයසේකර මහතා එම දෙපාර්තමේන්තුවේ තක්සේරුකරු ලෙස.

1961 දෙසැම්බර් මස 18 වැනි දින සිට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සහකාර තක්සේරුකරු වී. කුමරේෂන් මහතා එම දෙපාර්තමේන්තුවේ තක්සේරුකරු ලෙස.

1961 අගෝස්තු මස 31 වැනි දින සිට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සහකාර තක්සේරුකරු කේ. තන්ගරාජා මහතා එම දෙපාර්තමේන්තුවේ තක්සේරුකරු ලෙස.

1961 ඔක්තෝබර් මස 6 වැනි දින සිට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සහකාර තක්සේරුකරු කේ. තනබාලසිංහම් මහතා එම දෙපාර්තමේන්තුවේ තක්සේරුකරු ලෙස.

ඒ. 41/47

1962 අගෝස්තු මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සිවිල් සේවක එන්. පී. විජයරත්න මහතා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් ලෙස වැඩ බැලීමට.

එන්. පී. විජයරත්න,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 අගෝස්තු මස 6 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහා ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.
තැ. පෙ. 500.

8-463

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

1962 අංක 326

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේ ය :—

අංකය : ජේඑඒ. 11/48.

ඕ. එල්. ද ක්‍රෙට්සර් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 ජූලි 27 වැනි දින සිට, කොළඹ දිස්ත්‍රික් උසාවියේ අංක. 8505/එල් දරණ නඩුවේ තීන්දුව දීමට, කොළඹ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑඒ. 11/48.

සී. ජේ. ආර්. ගුණවර්ධන මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 ජූලි 31 වැනි දින සිට, කොළඹ දිස්ත්‍රික් උසාවියේ අංක. 44295 සහ 50807 දරණ නඩුවල තීන්දු දීමට හා 1962 අගෝස්තු 4 වැනි දින සිට, කොළඹ දිස්ත්‍රික් උසාවියේ අංක. 50091/එම් දරණ නඩුව අවසාන වන තුරු ඇසීමට හා තීන්දුව දීමට, කොළඹ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑඒ. 25/46.

වී. එම්. කුමාරසාමි මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 අගෝස්තු 1 වැනි දින සිට, යාපනේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක එම්. 621, එම්. 23521, එම්. 24167, එම්. 24168 සහ 24169 දරණ නඩුවල තීන්දු දීමට, යාපනේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා යාපනේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්/17සී/62.

ජේ. ජේ. එෆ්. ඩයස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, වී. එම්. ගුරුසාමි මහතා 1962 ජූලි 30 වැනි දින, මහනුවර, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මහනුවර, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, දුම්බර, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා මහනුවර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 1/සී/53.

එම්. එම්. අබ්දුල් කාදර් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. සී. කනගසිංහම් මහතා 1962 ජූලි 26 වැනි දින, ත්‍රිකුණාමලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, ත්‍රිකුණාමලේ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොම සාරිස් ධුරයට, අනුරාධපුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා අනුරාධපුරේ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්./8පී/57.

බී. ඊ. ද සිල්වා මහතා නැවත වැඩ බාරගන්නා තුරු හෝ නැවත නියමයක් කරන තුරු, පී. එන්. බර්තොලමියුස් මහතා, 1962 ජූලි 26 වැනි දින දින සිට, නුවරඑලියේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, නුවරඑලියේ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, නුවරඑලියේ, අතිරේක නාගරික මහේස්ත්‍රාත් ධුරයට, හා බදුල්ල-හල්දුම්මුල්ල, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 3ඒ/59.

ඒ. එම්. අමීන් මහතා නැවත වැඩ බාරගන්නා තුරු හෝ නැවත නියමයක් කරන තුරු, සී. ජී. එස්. ද සිල්වා මහතා 1962 ජූලි 27 වැනි දින සිට (කුලියාපිටියේ පලාත් ආණ්ඩු සභාව පිහිටි සීමාව තුල) කනදුල්ලේ පිහිටි උසාවියේ ක්‍රියා කරන පිණිස, කුරුණෑගල, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා (කුලියාපිටියේ පලාත් ආණ්ඩු සභාව පිහිටි සීමාව තුල) කනදුලේ පිහිටි උසාවියේ ක්‍රියා කරන පිණිස, කුරුණෑගල, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 63ඒ/58.

ජේ. ජී. එල්. සුවාරිස් මහතා නැවත වැඩ බාරගන්නා තුරු හෝ නැවත නියමයක් කරන තුරු, එල්. වී. බී. ද ජැකොලයින් මහතා 1962 අගෝස්තු 2 වැනි දින සිට, අවිස්සාවේල්ලේ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා අවිස්සාවේල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 40ඒ/60 (II).

සී. එල්. ටී. මූනමලේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. අමරසිංහ මහතා, 1962 අගෝස්තු 4 වැනි දින සිට 6 වැනි දින දක්වා, හම්බන්තොට, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, තංගල්ලේ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 12ඒ/57.

කේ. සී ඊ. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එන්. එම්. ඒ. වික්‍රමසූරිය මහතා 1962 අගෝස්තු 10 වැනි දින සිට 20 වැනි දින දක්වා, තංගල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, තංගල්ලේ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා හම්බන්තොට, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 12ඒ/57 (ඒ).

කේ. සී. ඊ. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. අමරසිංහ මහතා 1962 අගෝස්තු 16 වැනි දින, තංගල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, තංගල්ලේ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා හම්බන්තොට, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 42සී/54 (ඒ).

ජී. සී. නයිල්ස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. ඩබ්ලිව්. වික්‍රමසිංහ මහතා 1962 අගෝස්තු 13 වැනි, 15 වැනි දින සිට 18 වැනි දින දක්වා හා 20 වැනි දිනද, මාතර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා මාතර, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 41ඒ/60 (II).

එස්. ජේ. එම්. ජී. එස්. මුදන්නායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඩබ්ලිව්. ද සිල්වා මහතා 1962 අගෝස්තු 3 වැනි දින සිට 6 වැනි දින දක්වා, හා 8 වැනි දින සිට 10 වැනි දින දක්වා, කළුතර, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා කළුතර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 49ඒ/53.

එම්. පී. සී. රත්නම් මහතා නැවත වැඩ බාරගන්නා තුරු හෝ නැවත නියමයක් කරන තුරු, ටී. පී. සී. කාරන් මහතා 1962 අගෝස්තු 6 වැනි දින සිට, මීගමුවේ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මීගමුවේ, අතිරේක නාගරික මහේස්ත්‍රාත් ධුරයට, හා මීගමුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්/7ඒ/56.

එල්. එච්. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එෆ්. වී. එච්. ලාබ්‍රොයි මහතා 1962 අගෝස්තු 11 වැනි දින සිට 17 වැනි දින දක්වා, නුවරඑලියේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, නුවරඑලියේ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, නුවරඑලියේ, අතිරේක නාගරික මහේස්ත්‍රාත් ධුරයට, හා බදුල්ල-හල්දුම්මුල්ල, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 29බී/61.

ඒ. බී. ජේ. ගුණවර්ධන සහ එස්. ඩී. ජයසුන්දර යන මහතුන් නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඩී. බී. රණසිංහ මහතා 1962 අගෝස්තු 3 වැනි දින, ගම්පහ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා ගම්පහ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : පීඑල්/කේ. 1/48.

එම්. බී. කප්පාගොඩ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ආර්. එම්. සී. රත්නායක මහතා 1962 අගෝස්තු 3 වැනි දින, මහනුවර දිස්ත්‍රික්කයේ, පාත දුම්බර සහ උඩ දුම්බර ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩබ්ලිව්. 10/53.

ටී. බී. වත්තෑව මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. ඩබ්ලිව්. ඒ. ඉමුනුවෙල් මහතා 1962 ජූලි 30 වැනි දින සහ 1962 අගෝස්තු 2 වැනි හා 3 වැනි දිනයන්හි, කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයේ හා වන්නි හත්පත්තුවේ, කටුගම්පොල හත්පත්තුවේ සහ හිරියාල හත්පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩබ්ලිව්. 9/53.

පී. ඩී. පී. විජේසේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. එස්. පෙරේරා මහතා 1962 ජූලි 31 වැනි දින, කළුතර දිස්ත්‍රික්කයේ නැගෙනහිර පස්දුන් කෝරළේ සහ බටහිර පස්දුන් කෝරළේ සහ කළුතර තොටමුනේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/අයි. 4/52.

ජේ. ඊ. ඉලංගන්තිලක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, පී. එස්. මහාලේකමේ මහතා 1962 අගෝස්තු 3 වැනි දින, මහනුවර දිස්ත්‍රික්කයේ තුම්පනේ, හරිස්පත්තුවේ, පාත හේවාහැට සහ උඩහේවාහැට ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඒ. 5/53.

ඒ. බී. අළුවිහාරේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඩී. සී. විජේවර්ධන මහතා 1962 අගෝස්තු 3 වැනි දින, අවිස්සාවේල්ල දිස්ත්‍රික්කයේ දෙහිගම්පල් කෝරළේ සහ පාත බුලත්ගම සහ අතුළුගම් සහ පනාවල් කෝරලයන්හි ගම්බද උසාවි සභාපති ධුරයේ හා බෙලිගල් සහ කුරුවිටි කෝරලයන්හි ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඒ. 10/62.

එච්. අමීන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එන්. එස්. සිවප්‍රගාසම් මහතා 1962 අගෝස්තු 3 වැනි හා 4 වැනි දිනයන්හි, මඩකලපුව දිස්ත්‍රික්කයේ එරුවිල්, පොරටිවු හා දකුණු මාන්මුනේ පත්තු ගම්බද උසාවි සභාපති ධුරයේ හා උතුරු මාන්මුනේ පත්තු ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඒ. 10/62.

එච්. අමීන් මහතා නැති අතර, සී. ටී. කාසිනාදර් මහතා 1962 අගෝස්තු 13 වැනි දින, මඩකලපුව දිස්ත්‍රික්කයේ එරුවිල්, පොරටිවු, හා දකුණු මාන්මුනේ පත්තු ගම්බද උසාවි සභාපති ධුරයේ හා උතුරු මාන්මුනේ පත්තු ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඒ. 10/62.

එච්. අමීන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. ඒ. සී. එම්. මීරා සයිබො මහතා 1962 අගෝස්තු 15 වැනි දින සිට 17 වැනි දින දක්වා, මඩකලපුව දිස්ත්‍රික්කයේ එරුවිල්, පොරටිවු හා දකුණු මාන්මුනේ පත්තු ගම්බද උසාවි සභාපති ධුරයේ හා උතුරු මාන්මුනේ පත්තු ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩබ්ලිව්. 9/53.

පී. ඩී. පී. විජේසේකර මහතා නැති අතර, එච්. එස්. අගලවත්ත මහතා 1962 අගෝස්තු 13 වැනි දින කළුතර දිස්ත්‍රික්කයේ නැගෙනහිර පස්දුන් කෝරලේ හා බටහිර පස්දුන් කෝරලේ සහ කළුතර තොටමුනේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

ඇන්. ඒ. ද ඇස් විජේසේකර,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 අගෝස්තු 2 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්‍යාලය,
තැ. පෙ. අංකය—573,
කොළඹ—12.

8-348

---

# වෙනත් පත් කිරීම් ආදිය

**1962 අංක 327**

20 වෙනි පරිච්ඡේදය වන ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 120 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින්—

අංකය : අයිඑන්කයු/එල් 1/1/62.

1962 ජූලි මස 7 වෙනි දින සිට, ඇම්. ජස්ටින් ද සිල්වා මහතා නැවත වැඩ භාරගන්නා තුරු, කොළඹ දිස්ත්‍රික්කයේ කඳවල කටාන ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට එල්. ඒ. ගනේපොල මහතාද,

අංකය : අයිඑන්කයු/එල් 3/2/62.

1962 ජූලි මස 7 වෙනි දින සිට, ඩබ්ලිව්. ඒ. එච්. ගුණසේකර මහතා නැවත වැඩ භාරගන්නා තුරු, මහනුවර දිස්ත්‍රික්කයේ පලිස් පත්තුවේ බටහිර ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ඇල්. බී. විජේසිංහ මහතාද,

අංකය : අයිඑන්කයු/එල් 4/4/62.

1962 ජූනි මස 28 වෙනි දින සිට, ආර්. යූ. අබේරත්න මහතා නැවත වැඩ භාරගන්නා තුරු, මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ අස්ගිරි උඩසියපත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට වයි. ඇම්. හීන්බණ්ඩා මහතාද,

අංකය : අයිඑන්කයු/එල් 4/3/62.

1962 ජූලි මස 7 වෙනි දින සිට, ඩී. කේ. පණ්ඩිතරත්න මහතා නැවත වැඩ භාරගන්නා තුරු, මාතලේ දිස්ත්‍රික්කයේ කොහොන්සිය පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට වී. විමලසිංහ මහතාද,

අංකය : අයිඑන්කයු/එල් 11/1/57.

1962 ජූලි මස 2 වෙනි දින සිට, ජේ. වී. පෙල්ඩානෝ මහතා නැවත වැඩ භාරගන්නා තුරු, මන්නාරම් දිස්ත්‍රික්කයේ තලෙයිමන්නාරම්-සේසාලෙයි කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ඒ. බී. පෙල්ඩානෝ මහතාද,

අංකය : අයිඑන්කයු/එල් 11/1/60.

1962 ජූලි මස 15 වෙනි දින සිට, ඇස්. ඇස්. රාජදුරෙයි මහතා නැවත වැඩ භාරගන්නා තුරු, මන්නාරම් දිස්ත්‍රික්කයේ මන්තායි උතුරු ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ඒ. ප්‍රනාන්දු මහතාද,

අංකය : අයිඑන්කයු/එල් 11/2/57.

1962 ජූලි මස 12 වෙනි දින සිට, කේ. මීරා මොහිදීන් මහතා නැවත වැඩ භාරගන්නා තුරු, මන්නාරම් දිස්ත්‍රික්කයේ විදත්තල්තිව් කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට එස්. පොන්නයියා මහතාද,

අංකය : අයිඑන්කයු/එල් 11/1/61.

1962 ජූලි මස 8 වෙනි දින සිට, එන්. එම්. අහමඩ් ලෙව්වායි මහතා නැවත වැඩ භාරගන්නා තුරු, මන්නාරම් දිස්ත්‍රික්කයේ උතුරු මුසාලි ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට අබ්දුල් රසාක් නයිනා මොහොමඩ් මහතාද,

අංකය : අයිඑන්කයු/එල් 11/1/59.

1962 ජූලි මස 2 වෙනි දින සිට, කේ. කේ. එස්. හබීබු මොහොමඩ් මහතා නැවත වැඩ භාරගන්නා තුරු, මන්නාරම් දිස්ත්‍රික්කයේ ඉරුක්කුලම්පිද්දි ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට කේ. කේ. මාපිලයිමරික්කාර් මහතාද,

අංකය : අයිඑන්කයු/එල් 14/4/62.

1962 ජූලි මස 13 වෙනි දින සිට, එච්. බී. දසනායක මහතා නැවත වැඩ භාරගන්නා තුරු, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉහල විසිදෙකේ බස්නාහිර කෝරළේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ඩී. ආර්. පී. බී. ඇල්ලේපොල මහතාද,

අංකය : අයිඑන්කයු/එල් 16/2/62.

1962 ජූනි මස 28 වෙනි දින සිට, ඩී. බී. ඒකනායක මහතා නැවත වැඩ භාරගන්නා තුරු, අනුරාධපුර දිස්ත්‍රික්කයේ උඩුරට කෝරළේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ආර්. ඇම්. කලුබණ්ඩා මහතාද,

අංකය : අයිඑන්කයු/එල් 18/2/62.

1962 ජූලි මස 3 වෙනි දින සිට, එච්. එච්. ඇන්. සිල්වා මහතා නැවත වැඩ භාරගන්නාතුරු, බදුල්ල දිස්ත්‍රික්කයේ යටිපළාත කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට පී. බී. වීරසේකර මහතාද,

අංකය : අයිඑන්කයු/එල් 18/1/62.

1962 ජූලි මස 3 වෙනි දින සිට, කේ. පී. එස්. විජේතුංග මහතා නැවත වැඩ භාරගන්නාතුරු, බදුලු දිස්ත්‍රික්කයේ බදුලු කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට පී. බී. රත්නායක මහතාද,

අංකය : අයිඑන්කයු/එල් 21/3/62.

1962 ජූලි මස 13 වෙනි දින සිට, කේ. ඇම්. අබේසිංහ මහතා නැවත වැඩ භාරගන්නාතුරු, අම්පාරේ දිස්ත්‍රික්කයේ වැවගම්පත්තු ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට කේ. තල්ලයිනාතන් මහතාද,

අංකය : ඒඅයි 3/4/62.

1962 ජූලි මස 12 වෙනි දින සිට, ස්ථිර පත්වීමක් කරන තුරු, මහනුවර දිස්ත්‍රික්කයේ ගම්පොල අධිකරණ කොට්ඨාශයේ ගඟ ඉහල කෝරළයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ඩී. එල්. රණසිංහ මහතාද,

අංකය : ඒඅයි 19/1/62.

1962 ජූලි මස 2 වෙනි දින සිට, ස්ථිර පත්වීමක් කරන තුරු, කෑගල්ල දිස්ත්‍රික්කයේ තුම්පලාත පත්තු ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩ බැලීමට කේ. ඊ. ඇම්. පී. අප්පුහාමි මහතාද,

අංකය : ඒඅයි 22/1/61.

1961 ජනවාරි මස 1 වැනි දින සිට, අම්පාරේ පාලන දිස්ත්‍රික්කයේ වැවගම්පත්තුවේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි ධුරය දරණ කාලය තුල එම කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂකවරයා වශයෙන් කේ. ඇම්. අබේසිංහ මහතාද,

අංකය : අයිඑන්කයු/එල් 18/1/58.

1962 ජූලි මස 17 වෙනි දින සිට, විල්මට් තල්දෙන මහතා නැවත වැඩ භාරගන්නාතුරු, බදුල්ල දිස්ත්‍රික්කයේ ඔය පළාත කෝරළේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට පුංචිබණ්ඩා රත්නායක මහතාද,

අංකය : අයිඑන්කයු/එල් 8/1/58.

1962 ජූලි මස 19 වෙනි දින සිට, ඇස්. ධම්බන්දු මහතා නැවත වැඩ භාරගන්නාතුරු, හම්බන්තොට දිස්ත්‍රික්කයේ බටහිර ගිරුවා පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට විල්මට් ගුණරත්න මහතාද,

අංකය : ඒඅයි 1/2/61.

1962 ජූලි මස 24 වෙනි දින සිට කොළඹ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළේ අදිකාරි පත්තුවේ හදිසි මරණ පරීක්ෂකවරයෙකු වශයෙන් ජේ. ඇම්. ඇස්. ජයසේකර මහතාද,

පත් කර ඇත්තේ ය.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩ බලන
ස්ථිර ලේකම්.

1962 ජූලි මස 27 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

8-468

1962 අංක 328

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ ගරු අධිකරණ අමාත්‍යවරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව එතුමා විසින්—

(1) එම්. බී. සෙනවිරත්න මහතා මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

(2) එස්. එච්. අප්පුහාමි මහතා හලාවත අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

(3) ටී. බී. නුගේගොඩ මහතා මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

(4) ජී. වී. ඞී. වික්‍රමසිංහ මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

පත්කර ඇත්තේ ය.

ඞී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන ස්ථිර ලේකම්.

1962.8.4 වෙනි දින,
කොළඹ අධිකරණ අමාත්‍යාංශයේදීය.

8-464

---

1962 අංක 329

අංකය : ජේ. 14/62

1944 අංක 13 දරණ ආඥාපනතින් සහ 1948 පෙබරවාරි මස 5 වෙනි දින අංක 9,828 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1948 පෙබරවාරි මස 4 වෙනි දින දරන ප්‍රකාශනයෙන් සංශෝධිත, 1939 අංක 48 දරන ළමයින් සහ තරුණ අය පිළිබඳ ආඥාපනතේ 3 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ ඇමතිතුමා විසින්—

1962, ජූලි මස 30 වෙනි දින සිට, ඇම්. හුසේන් මහතා, එම් මහතාගේ අතිකුත් රාජකාරි වලට අතිරේක වශයෙන්, ගාල්ලේ අධිකරණ කොට්ඨාශයෙහි ළමා මහෙස්ත්‍රාත්වරයා ලෙස පත් කර ඇත්තේ ය.

ඞී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩ බලන ස්ථිර ලේකම්.

1962, අගෝස්තු මස 3 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදීය.
8-465

---

1962 අංක 330

අංකය : ඞී. 32/රෙක් ව.

## රාජකීය ලංකා නාවික හමුදාව—නිලධාරීන්ගේ උසස් කිරීම්

1961 දෙසැම්බර් 1 වැනි දින සිට ලයිතන් හැටියට—

උප ලයිතන් ඒ. ඇන්. ද අන්ඩ්‍රාඩෝ, රාජකීය ලංකා නාවික හමුදාව.

ඇන්. කිවු. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 අගෝස්තු 2 වැනි දින,
කොළඹදී ය.

8-471/2

---

1962 අංක 331

අංකය : ඞී. 32/රෙක් ව.

## රාජකීය ලංකා නාවික හමුදාවේ නිලධාරීන්ගේ ස්ථිර කිරීම්

1962 මාර්තු 1 වැනි දින සිට පහත සඳහන් නිලධාරීන් උප ලයිතන් පදවියේ ස්ථිර කරන ලදී:—

වැඩ බලන උප ලයිතන් ඞී. පී. ජී. ලියනගේ, රාජකීය ලංකා නාවික හමුදාව.

වැඩ බලන උප ලයිතන් ඩබ්ලිව්. ඩබ්ලිව්. ඊ. සී. ප්‍රනාන්දු, රාජකීය ලංකා නාවික හමුදාව.

ඇන්. කිවු. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 අගෝස්තු 2 වැනි දින,
කොළඹදී ය.

8-471/1

---

1962 අංක 332

## දැන්වීමයි

නානායක්කාරගොඩ-කන්දේ ආරච්චිගේ හර්ෂදේව ද සිල්වා විජේසේකර මහතා කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි සහ සිංහල භාෂාවන්ගෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු අමාත්‍යතුමා විසින් පත්කර තිබේ.

වී. එල්. වීරසිංහ,
කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 ජූලි මස 27 වැනි දින,
කොළඹ දීය.

8-308

---

1962 අංක 333

## දැන්වීමයි

කන්දයියා සෝමස්කන්දන් මහතා යාපනය අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු අමාත්‍යතුමා විසින් පත්කර තිබේ.

වී. එල්. වීරසිංහ,
කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 ජූලි මස 24 වැනි දින,
කොළඹ දීය.

8-309

---

1962 අංක 334

(115 පරිච්ඡේදයේ) මුස්ලිම් විවාහ හා දික්කසාද ආඥාපණතේ 12 (6) වැනි වගන්තිය යටතේ කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් ත්‍රිකුණාමලයේ පල්ලිය පාරේ පදිංචි ඔමර් ලෙබ්බෙ මොහමඩ් ඉස්මයිල් මහතා ත්‍රිකුණාමල අධිකරණ කොට්ඨාශයේ ක්වාසිවරයා වශයෙන් කළ පත්කිරීම 1962 සැප්තැම්බර 1 වැනිදා පටන් අවලංගු කරන්නට යෙදුනා ඇත.

වී. එල්. වීරසිංහ,
කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 ජූලි මස 26 වැනි දින,
කොළඹ.

8-328/1

---

1962 අංක 335

(115 පරිච්ඡේදයේ) මුස්ලිම් විවාහ හා දික්කසාද ආඥාපණතේ 12 (1) වැනි වගන්තිය යටතේ කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් 1962 සැප්තැම්බර් මස 1 වැනි දින සිට 1963 අගෝස්තු මස 31 වැනි දින දක්වා ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කොට්ටියාර් පත්තු ආදායම් කොට්ඨාශයේ ක්වාසි තනතුරට මුතූර්හි අංක 5 දරණ කොට්ඨාශයේ හජ්ජියාර් ඇන්. ඇම්. අලියාර් තම්බි මහතා පත් කරන්ට යෙදුනා ඇත.

වී. එල්. වීරසිංහ,
කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 ජූලි මස 13 වැනි දින,
කොළඹ 7.

8-328/2

---

1962 අංක 336

(115 වැනි පරිච්ඡේදයේ) මුස්ලිම් විවාහ හා දික්කසාද ආඥාපනතේ 12 (1) වැනි වගන්තිය යටතේ කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් 1962 සැප්තැම්බර් මස 1 වෙනි දින සිට 1963 සැප්තැම්බර් මස 30 වෙනි දින දක්වා ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කොට්ටියාර් පත්තු ආදායම් කොට්ඨාශය හැර ත්‍රිකුණාමල අධිකරණ කොට්ඨාශයේ ක්වාසි තනතුරට කින්නියා වේ, පෙරිය කින්නියාහි අංක 7 කොට්ඨාශයේ මොහමඩ් සාලිහු ආලිම් හජ්ජියාර් මහමුදු බාවා නොහොත් මොහමඩ් අබ්දුල් ලා පත්කරන්නට යෙදුනා ඇත.

වී. එල්. වීරසිංහ,
කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම්.

1962 ජූලි මස 14 වැනි දින,
කොළඹ 7.

8-315

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය

# ආණ්ඩුවේ නිවේදන

## ආදායම් බදු ආඥා පනත

අංකය : 965/15/136 (එස් බී/ඊපී).

### 44 සී (1) වගන්තිය යටතේ නිවේදනය

1957 අංක 56 දරන පනතින් සංශෝධිත (242 අධිකාරයවන) ආදායම් බදු ආඥා පනතේ 44සී (1) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව මුදල් ඇමති ෆීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, මෙහි ඇති උපලේඛනයේ විස්තර කෙරෙන යෝජනා ක්‍රමය, කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය යයි සලකනු ලබන හෙයින්, කර්මාන්ත, සවදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිතුමාගේ ඉල්ලීම පිට මෙම නිවේදනයෙන්, මේ වගන්තියේ කාර්ය සඳහා අනුමත කරනු ලැබූ යෝජනා ක්‍රමයක් වශයෙන් ප්‍රකාශ කරමි.

ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
මුදල් ඇමති.

1962 ජූලි 31 වෙනි දින,
කොළඹ.

### උපලේඛනය

1. ත්‍රිකුණාමල තොටුපලෙන් තේ පැටවීම පිළිබඳව සේවයක් තේ අපනයන කරන්නන් හට සැලසීම උදෙසා පිහිටුවන ලද සීමාසහිත ත්‍රිකුණාමල තේ පරිපාලන සමාගම නමැති යෝජනා ක්‍රමය.

8-489

---

එල්. ඩී. බී. 59/58.

## 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනත

### 3 (2) වෙනි වගන්තිය යටතේ කරන ලද දැන්වීමයි

1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3 වෙනි වගන්තියේ 2 වෙනි උප වගන්තියේ විධිවිධාන අනුව, අධිකරණ ඇමති තැන්පත් සැමුවෙල් පීටර් ක්‍රිස්ටෝපර් ප්‍රනාන්දු වන මම මෙහි ඇති උප ලේඛනයේ සඳහන් එක් එක් ගම් ප්‍රදේශයක් සඳහා සමගිදායක සින්ගේ සභාවක් බැගින් පිහිටුවීමට අදහස් කර ඇති බව සහ ඒ ගම් ප්‍රදේශයේ ගම්කායයී සභාවද, ඒ ගම් ප්‍රදේශයේ සැම ග්‍රාම සංවර්ධන සමිතියක් හා සැම ප්‍රජාමණ්ඩලයක්ද, සමුපකාර සමිති ආඥාපනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ ඒ ගම් ප්‍රදේශයේ සැම සමුපකාර සමිතියක්ද විසින් නිර්දේශ මණ්ඩලයේ මනය පරිදි ඒ සභාවේ සාමාජිකයන් වීමට සුදුසු තැනැත්තන්, 1962 අගෝස්තු මස 31 වෙනි දින හෝ ඊට පළමු මා වෙත නිර්දේශ කළ හැකි බව මෙයින් දන්වමි.

සැම් පී. සී. ප්‍රනාන්දු,
අධිකරණ ඇමති.

1962 අගෝස්තු මස 1 වෙනි දින,
කොළඹ අධිකරණ අමාත්‍යාංශයේ දීය.

### උපලේඛනය

1. ගාලු දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තු ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි මාදම්පේ ගම් ප්‍රදේශය.

2. කොළඹ දිස්ත්‍රික්කයේ බටහිර සියනෑ කෝරළේ (මැද පත්තුව) ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි බෙම්මුල්ල ගම් ප්‍රදේශය.

8-466

---

## බන්ධනාගාර ආඥාපණත

වර්ෂ 1939 අංක 53 දරණ ආඥා පණතින් සංශෝධනය කොට වර්‍ෂ 1947 සැප්තැම්බර් 24 වැනි දින අංක 9,773 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ප්‍රකාශයෙන් වෙනස් කර ඇති (44 වැනි පරිච්ඡේදය වන) බන්ධනාගාර ආඥා පණතේ 32 (1) (ආ) දරණ වගන්තියේ ප්‍රකාර, මෙහි උප ලේඛනයේ II වැනි තීරයේ සඳහන් තැනැත්තන්, මෙම දැන්වීමේ සඳහන් දින සිට තුන් අවුරුදු කාලය කට, උපලේඛනයේ I වැනි තීරයේ සඳහන් ආයතනයේ ප්‍රාදේශීය සෝදිසි කොමිටියේ සාමාජිකයන් වශයෙන්, කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු භාර ගරු ඇමතිවරයා විසින් පත් කොට තිබේ.

කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු භාර
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙනුවටය.

1962 අගෝස්තු මස 3 වැනි දින,
කොළඹ 7,
කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු භාර
අමාත්‍යාංශය.

### උපලේඛනය

| I | II |
|---|---|
| මඩකලපුව බන්ධනාගාරය | 1. ටී. කරුණාරත්නම් මහතා |
| | 2. වී. එලියතම්බි මහතා |
| | 3. ඩී. ජේ. බී. ජගනායගම් මහතා |

8-363

---

## බන්ධනාගාර ආඥාපණත

වර්ෂ 1939 අංක 53 දරණ ආඥා පණතින් සංශෝධනය කොට වර්‍ෂ 1947 සැප්තැම්බර් 24 වැනි දින අංක 9,773 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ප්‍රකාශයෙන් වෙනස් කර ඇති (44 වැනි පරිච්ඡේදය වන) බන්ධනාගාර ආඥා පණතේ 32 (1) (ආ) දරණ වගන්තියේ ප්‍රකාර, මෙහි උප ලේඛනයේ II වැනි තීරයේ සඳහන් තැනැත්තන්, මෙම දැන්වීමේ සඳහන් දින සිට තුන් අවුරුදු කාලය කට, උපලේඛනයේ I වැනි තීරයේ සඳහන් ආයතනයේ ප්‍රාදේශීය සෝදිසි කොමිටියේ සාමාජිකයන් වශයෙන්, කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු භාර ගරු ඇමතිවරයා විසින් පත් කොට තිබේ.

කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු භාර
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙනුවටය.

1962 අගෝස්තු 4 වැනි දින,
කොළඹ 7,
කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු භාර
අමාත්‍යාංශය.

### උපලේඛනය

| I | II |
|---|---|
| බදුල්ල බන්ධනාගාරය | 1. පී. බී. රාජපක්ෂ මහතා |
| | 2. ජී. ඩී. ගුණසේකර මහතා |
| | 3. ජී. කේ. සාම්විචි අප්පු මහතා |

8-358

---

## 1961 අංක 13 දරණ වගාරක්‍ෂණ පනත යටතේ සම්පාදිත 7 (1) වෙනි වගන්තිය යටතේ කරන ආඥාවයි

කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල පිළිබඳ අමාත්‍ය චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම වර්‍ෂ 1961 අංක 13 දරන වගාරක්ෂණ පනතේ 7 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ පැවරී තිබෙන බලය ප්‍රකාර මෙහි පහත දක්වන උපලේඛනයේ සඳහන් වන සෑම ප්‍රදේශයකම වී වගාව එම පනතේ සලස්වා ඇති පරිදි අනිවාර්ය වශයෙන්ම රක්ෂණය වියයුතු බැව් මෙයින් නියම කරමි.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල
පිළිබඳ අමාත්‍ය.

1962 අගෝස්තු මස 3 දින,
කොළඹ දීය.

### උපලේඛනය

(1) කොළඹ දිස්ත්‍රික්කයේ බටහිර සියනෑ කෝරළයේ මැද පත්තුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ ඇති මෙහි පහත දක්වන සෑම ගොවි මණ්ඩලයකටම අයත් ප්‍රාදේශීය අධිකරණ බල ප්‍රදේශ :—

1. ගම්පහ අළුත්ගම
2. යක්කල
3. හෙනරත්ගොඩ
4. බැන්ඩියමුල්ල
5. පරකන්දෙනිය
6. වැලිවේරිය බටහිර
7. මල්වතුහිරිපිටිය

8. තිහාරිය
9. කලගෙඩිහේන
10. බෝරුක්ගමුව
11. කුඹල්ඔළුව

(ii) කොළඹ දිස්ත්‍රික්කයේ උතුරු අළුත් කුරු කෝරළයේ "බී" ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ ඇති මෙහි පහත දක්වන සෑම ගොවි මණ්ඩලයකටම අයත් ප්‍රාදේශීය අධිකරණ බල ප්‍රදේශ :—

1. දොරණගොඩ
2. විගොඩමාරපොල
3. කොටුගොඩපත්තඹුවන
4. මාදෙල්ගමුව සියඹලාපිටිය
5. කෙහෙල්ඇල්ල
6. තම්මිට දෙල්වගුර
7. වෙළගාන
8. කිඹුලපිටිය
9. නැදගමුව කෙහෙල්බද්දර
10. කොන්දගම්මුල්ල
11. කළුවරිප්පුව
12. පොල්වත්ත ගල්ඔළුව
13. කලවාන වැගොව්ව

(iii) කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ ඇති මෙහි පහත දක්වන සෑම ගොවි මණ්ඩලයකටම අයත් ප්‍රාදේශීය අධිකරණ බල ප්‍රදේශ :—

1. තලවතුගොඩ කලල්ගොඩ
2. තලංගම දකුණ
3. මාලබේ
4. වැලිවිට
5. නවගමුව
6. කනම්පැල්ල
7. කළුඅග්ගල
8. දිද්දෙනිය
9. බෝපේ

(iv) කළුතර දිස්ත්‍රික්කයේ බටහිර පස්දුන් කෝරළයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ ඇති මෙහි පහත දක්වන සෑම ගොවි මණ්ඩලයකටම අයත් ප්‍රාදේශීය අධිකරණ බල ප්‍රදේශ :—

1. දොඩම්ගොඩ බටහිර
2. දොඩම්ගොඩ නැගෙනහිර

(v) කළුතර දිස්ත්‍රික්කයේ කළුතර තොටමුනේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ ඇති මෙහි පහත දක්වන සෑම ගොවි මණ්ඩලයකටම අයත් ප්‍රාදේශීය අධිකරණ බල ප්‍රදේශ :—

1. බෝඹුවල
2. නාගොඩ
3. වලතර

(vi) මාතර දිස්ත්‍රික්කයේ වැලිගම් කෝරළයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ ඇති මෙහි පහත දක්වන සෑම ගොවි මණ්ඩලයකටම අයත් ප්‍රාදේශීය අධිකරණ බල ප්‍රදේශ :—

1. වරකාපිටිය
2. මිරිස්ස
3. කොටවිල
4. කඹුරුගමුව
5. ඉහළ කියාඹුව
6. ඇල්ගිරිය පහළ කියාඹුව
7. උතුරු මාලිම්මඩ
8. නැගෙනහිර මාලිම්මඩ

(vii) මාතර දිස්ත්‍රික්කයේ ගඟබඩ පත්තුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ ඇති මෙහි පහත දක්වන සෑම ගොවි මණ්ඩලයකටම අයත් ප්‍රාදේශීය අධිකරණ බල ප්‍රදේශ :—

1. කරගොඩ උයන්ගොඩ අංක 3
2. කරගොඩ උයන්ගොඩ අංක 1
3. පිටකටුවන
4. කරගොඩ උයන්ගොඩ අංක 6
5. කිරින්ද මහින් ඉහළ හෙට්ටියාව
6. වලකන්ද වටුකොළ කන්ද
7. කිරින්ද මහින් පහළ අක්කලගමුව
8. හඳපාන්වල පුහුල් ඇල්ල

(viii) හම්බන්තොට දිස්ත්‍රික්කයේ මාගම් පත්තුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ ඇති මෙහි පහත දක්වන සෑම ගොවි මණ්ඩලයකටම අයත් ප්‍රාදේශීය අධිකරණ බල ප්‍රදේශ :—

1. ජයවික්‍රම යාය
2. වරාකනත්ත
3. ගාඩින් යාය
4. රබර් වත්ත
5. රත්නෙළුම්වල යාය
6. ගගේ යාය
7. දිරසේකර යාය
8. වලගම්පත්තුව
9. පිරිස් යාය
10. හෙළඹගස්වල
11. කච්චේරිගම
12. කාසිම්ගම
13. මරලවැව
14. පතානයාය
15. ලූකස්ගොඩ
16. ඉරිගේඅන් යාය
17. දියෙස් යාය
18. උඩස්ගම
19. සඳගිරිගොඩ
20. මූදියන්සේගම
21. අකුරුගොඩ
22. කෑගල්ල යාය
23. අන්දරගස් යාය
24. ගොඩගම යාය
25. සුපිරින්වැන්ඩන්විගම
26. කරිවිල
27. මැදගම 62

(ix) හම්බන්තොට දිස්ත්‍රික්කයේ නැගෙනහිර ගිරුවා පත්තුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ ඇති මෙහි පහත දක්වන සෑම ගොවි මණ්ඩලයකටම අයත් ප්‍රාදේශීය අධිකරණ බල ප්‍රදේශ :—

1. පන්ගම්විල වකමුල්ල
2. අත්තනයාල
3. වකමුල්ල දකුණු ඉ. 2
4. වකමුල්ල දකුණු ඉ. 3
5. හකුරුවෙල දකුණු ඉ. 1
6. හකුරුවෙල දකුණු ඉ. 2
7. හකුරුවෙල වම් ඉ. 1
8. රන්න දකුණු ඉ. 2
9. මැදගම 44
10. නෙටොල්පිටිය

(x) වවුනියාව දිස්ත්‍රික්කයේ උතුරු වවුනියාව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ ඇති මෙහි පහත දක්වන සෑම ගම්මුලාදෑනි කොට්ඨාශයකටම අයත් ප්‍රාදේශීය අධිකරණ බල ප්‍රදේශ :—

1. නයිනමඩු
2. පුලියන්කුලම්
3. කනකරායන්කුලම්
4. මාන්කුලම්
5. ඔළුමඩු
6. කරුප්පට්ටි මුරිප්පු

(xi) වවුනියාව දිස්ත්‍රික්කයේ දකුණු වවුනියාව (දෙමළ අංශය) ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ ඇති මෙහි පහත දක්වන සෑම විවිධ සේවා සමුපකාර සමිතියකටම අයත් ප්‍රාදේශීය අධිකරණ බල ප්‍රදේශ :—

1. චලම්පසිකුලම්
2. නොච්චි මෝට්ටෙයි
3. පේයාඩි කුලුන් කුලම්
4. පූවාරසන් කුලම්
5. තාන්ඩිකුලම්
6. වවුනියාව
7. වවුනියාව (මධ්‍යම පෙදෙස)
8. වවුනියාව නැගෙනහිර
9. වවුනියාව බටහිර
10. වෙප්පන්කුලම්

(xii) මඩකලපු දිස්ත්‍රික්කයේ දකුණු මන්මුනේ සහ එරුවිල් පොරතිවු පත්තුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ ඇති මෙහි පහත දක්වන සෑම කන්දම් ප්‍රදේශ :—

1. කිලක් කට්ටිචේනෙයි
2. නාත් පදුවට්ටෙයි
3. වෙල්ලමයිචේනෙයි

(xiii) මඩකලපු දිස්ත්‍රික්කයේ උතුරු මන්මුනේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය තුළ ඇති මෙහි පහත දක්වන සෑම කන්දම් ප්‍රදේශ ඇතුළත ප්‍රදේශ :—

1. වවුනතිවු
2. එරුමයිතීවු
3. සේතුකුඩා

(xiv) මඩකලපු දිස්ත්‍රික්කයේ කෝරළේ පත්තුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය තුළ ඇති මෙහි පහත දක්වන සැම කන්දම් ප්‍රදේශ ඇතුළත ප්‍රදේශ :—

| | |
|---|---|
| 1. වෙට්ටුකාට්ටුවලිමේල් <br> 2. වෙට්ටුකාට්ටුවලිකිලල් <br> 3. සූදුපතිනන්වේනෙයි කන්දමේ කොටසක් | මායිම <br> උතුරට : වාහනේරි වැවේ ඩී/1 වාරි මාර්ග ඇල <br> දකුණට : සන්ට්යාරු ඔය සහ ඉලව්වලි ඇල <br> නැගෙණහිරට : පුතුවලි ආරු <br> බස්නාහිරට : කරවේනෙයි කෘෂිකර්ම පාර |

(xv) අම්පාරේ දිස්ත්‍රික්කයේ සමන්තුරෙයි පත්තුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ ඇති මෙහි පහත දක්වන සැම ජනපද ප්‍රදේශ සීමාවක්ම ඇතුළත ප්‍රාදේශීය අධිකරණ බල ප්‍රදේශ :—

1. ජනපද 7
2. ජනපද 26
3. ජනපද 6

(xvi) කුරුණෑගල දිස්ත්‍රික්කයේ හිරියාල හත්පත්තුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය තුළ ඇති මෙහි පහත දක්වන සැම ගොවි මණ්ඩලයකටම අයත් ප්‍රාදේශීය අධිකරණ බල ප්‍රදේශ :—

1. ජහපාගම
2. තම්මිටමානපාය
3. අරන්කැලේ
4. ගොකරැල්ල
5. ලේනව
6. මැල්සිරිපුර
7. කැන්දවල.

(xvii) කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පොල හත්පත්තුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ ඇති මෙහි පහත දක්වන සැම ගොවි මණ්ඩලයකටම අයත් ප්‍රාදේශීය අධිකරණ බල ප්‍රදේශ :—

1. කුඹල්වල
2. මාවල
3. දීගල්ල
4. ඉහළ මාකඳුර
5. පහළ මාකඳුර
6. සඳලංකාව

(xviii) කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ ඇති මෙහි පහත දක්වන සැම ගොවි මණ්ඩලයකටම අයත් ප්‍රාදේශීය අධිකරණ බල ප්‍රදේශ :—

1. පානව
2. වාරියපොල
3. හබරාව
4. විලකටුපොත
5. රන්දෙනිය

(xix) අනුරාධපුර දිස්ත්‍රික්කයේ උතුරු හුරුළු පලාත ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය තුළ ඇති මෙහි පහත දක්වන සැම විවිධ සේවා සමුපකාර සමිතියකටම අයත් ප්‍රාදේශීය අධිකරණ බල ප්‍රදේශ :—

1. කඳුරුගස්කඩ
2. මහකුඹුක් වැව
3. රස්නක වැව
4. රත්මල්ගහ වැව
5. වලහ විද්ද වැව
6. ගෝනුගස්දෙන්නාව
7. ගෝනුමැරියාව
8. කැබිතිගොල්ලෑව
9. කිරිකෙටු වැව
10. කුන්චුට්ටුව
11. පිකිරිහැන්දෑව
12. වත්තේ වැව

(xx) අනුරාධපුර දිස්ත්‍රික්කයේ කලාගම් පලාත ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය තුළ ඇති මෙහි පහත දක්වන සැම විවිධ සේවා සමුපකාර සමිතියකටම අයත් ප්‍රාදේශීය අධිකරණ බල ප්‍රදේශ :—

1. අළුත්ගන්තිරියාගම
2. අමනක්කට්ටුව
3. අස්වැද්දුම
4. ඉපලෝගම ගන්තිරියාගම
5. කුඩුරුවේගම
6. කාගම
7. කලාවැව
8. කරන්බැව
9. කෝනපතිරාව
10. කුසලානගම
11. ආඩියාගල
12. බලලුවැව
13. කහලපරවහගම

(xxi) රත්නපුර දිස්ත්‍රික්කයේ නවදුන් කෝරළයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ ඇති මෙහි පහත දක්වන සැම ගොවි මණ්ඩලයකටම අයත් ප්‍රාදේශීය අධිකරණ බල ප්‍රදේශ :—

1. බටුගෙදර
2. මාරපොත
3. දෙනවක පාතකඩ 1
4. දෙනවක පාතකඩ 2

(xxii) රත්නපුර දිස්ත්‍රික්කයේ අටකලන් කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ ඇති මෙහි පහත දක්වන සැම ගොවි මණ්ඩලයකටම අයත් ප්‍රාදේශීය අධිකරණ බල ප්‍රදේශ :—

1. කලල්ඇල්ල
2. අටකලන්පන්න
3. මාදම්පේ
4. හිරමඩගම

(xxiii) කෑගල්ල දිස්ත්‍රික්කයේ දෙහිගම්පල් හා පාත බුලත්ගම කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ ඇති මෙහි පහත දක්වන සැම ගොවි මණ්ඩලයකටම අයත් ප්‍රාදේශීය අධිකරණ බල ප්‍රදේශ :—

1. වහරක
2. ඉඹුලාන
3. අම්තිරිගල
4. මාපිටිගම
5. බෝපැත්ත
6. වැන්දල
7. යටියන්තොට
8. උඩුව
9. කිතුල්ගල
10. කන්නත්තොට

(xxiv) කෑගල්ල දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරළයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ ඇති මෙහි පහත දක්වන සැම ගොවි මණ්ඩලයකටම අයත් ප්‍රාදේශීය අධිකරණ බල ප්‍රදේශය :—

1. කබගමුව
2. නාරන්ගොඩ
3. ඉඹුල්ගල
4. ආසිදෙනිය
5. පෙහෙරබේ
6. කොබ්බෑවල
7. හත්නාගොඩ
8. මකුද්දල
9. හැලියගොඩ
10. ඇගල්ල
11. මොරවක
12. අක්වත්ත
13. මංගෙදර
14. තෝලන්ගමුව
15. බුරුන්නෑව
16. ජාලක්කන්ද
17. දැදිගම
18. පල්ලේගම
19. මල්මඩුව වේරගල

8-359/1

## 1961 අංක 13 දරන වගාරක්ෂණ පනත යටතේ සම්පාදිත 24 (1) වගන්තිය යටතේ කරන නිවේදනයයි

කෘෂිකර්ම, ඉඩම, වාරිමාර්ග හා විදුලිබලය පිළිබඳ අමාත්‍ය චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මට 1961 අංක 13 දරන වගාරක්ෂණ පනතේ 24 (1) වෙනි වගන්තිය යටතේ පැවරී තිබෙන බලය ප්‍රකාර 1962–1963 මහ කන්නයේ සහ 1963 යල් කන්නයේ වී ගොවිතැනට වන්දි ගෙවීමේදී ගෙවිය යුතු ප්‍රමාණයන් මෙහි පහත දක්වෙන උපලේඛනයේ අන්දමට වියයුතු බැව් මෙයින් නියම කරමි.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම, වාරිමාර්ග හා විදුලිබලය පිළිබඳ අමාත්‍ය.

1962 අගෝස්තු මස 3 දින,
කොළඹ දීය.

### උපලේඛනය

| ගොවිතැනේ අවස්ථාව | සම්පූර්ණයෙන් අලාභ වූ විට ප්‍රමාණය | අලාභය කොටස් වශයෙන් සිදුවූ විට — අලාභය සියයට ගණනින් | ප්‍රමාණය |
|---|---|---|---|
| නැවත වරක් වැපිරීමට හෝ පැල සිටුවීමට නුපුළුවන් කාලයේ සිට පූදින කාලය දක්වා ඇති කාල සීමාව තුළ අලාභය සිදුවූ විට | ගෙවිය හැකි වැඩිම වන්දි ප්‍රමාණයෙන් සියයට 70 | 30 සහ 30 අඩු ... | නැත |
| | | 30 ට වැඩි ... | මෙම අවස්ථාවේදී සම්පූර්ණ අලාභයක් සිදු වූ විට ගෙවන වන්දි ප්‍රමාණය හා සමානම සියයට ගණන අලාභයේ සියයට ගණන වියයුතුයි. |
| පූදින කාලයේ සිට ගොයම් කපා බේරන දිනය, දක්වා ඇති කාලසීමාව තුළ අලාභය සිදුවූ විට | ගෙවිය හැකි වැඩිම වන්දි ප්‍රමාණයෙන් සියයට 100 | 30 සහ 30 අඩු ... | නැත. |
| | | 30 ට වැඩි ... | අලාභයේ සියයට ගණන ගෙවිය යුතු වැඩිම වන්දි ප්‍රමාණයේ සියයට ගණන හා සමානම වියයුතුයි. |

8–359/2

---

## 1961 අංක 13 දරන වගාරක්ෂණ පනත

### 12 (1) වෙනි වගන්තිය යටතේ කරන ආඥාවයි

කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල පිළිබඳ අමාත්‍ය චාල්ස් පර්සිවල් ද සිල්වා වන මම 1961 අංක 13 දරන වගාරක්ෂණ පනතේ 12 (1) වෙනි වගන්තිය යටතේ පැවරී තිබෙන බලය ප්‍රකාර 1962-1963 මහ කන්නය ආරම්භ වන දිනයේ පටන් ගණන් ගෙන එක් අවුරුදු කාල සීමාවක් තුන්වෙනි රක්ෂණ වාරය ලෙස මෙම ආඥාවෙන් නියම කරමි.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල පිළිබඳ අමාත්‍ය.

1962 අගෝස්තු මස 3 දින,
කොළඹදීය.

8-359/3

---

## 1961 අංක 13 දරන වගාරක්ෂණ පනත

### 11 (1) වෙනි උප වගන්තිය යටතේ කරන ආඥාවයි

1961 අංක 13 දරන වගාරක්ෂණ පනතේ 11 (1) වගන්තිය යටතේ කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල පිළිබඳ අමාත්‍ය තුමා විසින් කරන ආඥාවයි.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල පිළිබඳ අමාත්‍ය.

1962 අගෝස්තු මස 3 දින,
කොළඹ දීය.

### ආඥාව

1961 අංක 13 දරන වගාරක්ෂණ පනතේ 11 (1) වගන්තියෙහි කාර්යය සඳහා මෙහි පහත දක්වන හේතුන් නියමිත හේතුන් විය යුතුය :—

1. අවශ්‍ය ප්‍රමාණ ජලය නොලැබීම
2. නියඟය
3. වුවමනාවට වඩා ජලය වැඩිවීම
4. ජලගැල්ම
5. ගොයම් රෝග
6. කෘමි වසංගත
7. කොමසාරිස්වරයා විසින් සම්මත ගොවිතැන් ක්‍රම අනුගමනය කිරීම
8. වල් ඌරන්.

8-359/4

---

## 1954 අංක 12 දරණ කිරි මණ්ඩල පනත
### නිවේදනයයි

1954 අංක 12 දරණ කිරි මණ්ඩල පනතේ 4 (1) ඡේදය යටතේ ගරු කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබලය පිළිබඳ ඇමතිතුමා විසින් කිරි මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් වම් 1962 අගෝස්තු මස 2 වෙනි දින සිට අවුරුදු 5 ක කාලයකට සිරිල් ආර්. මුතුකුමාරු මහතා පත් කර ඇති බව මෙයින් දනුම් දෙනු ලැබේ.

එම්. ශ්‍රී කාන්ත,
අතිරේක නිත්‍ය ලේකම්,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල අමාත්‍යාංශය.

1962. 8. 2,
කොළඹදී ය.

8-316

---

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 දරණ ඡේදය යටතේ සහතිකය

පළාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිවර, මහානාම සමරවීර වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උප මෙහි පහත සඳහන් උප ලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මඟින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

මහානාම සමරවීර,
පාළත් පාලන හා නිවාස ඇමති තුමා.

1962 ජූලි මස 25 වෙනි දින දීය,
කොළඹ 2.

### උපලේඛනය

උතුරු පළාතේ, මන්නාරම දිස්ත්‍රික්කයේ, මන්නාරම ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ, මන්නාරම නගරය ගම්මුලාදැනි වසමේ පිහිටි පෙරියකාමක්කු කඩ්ඩුකානි නමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති අක්කර 5 ක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක් :—

උතුරට : මන්නාරම ඡන්ද කොට්ඨාශයේ ගොවිපලක් සඳහා අත් පත් කර ගැනීමට යන ඉඩම ; නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ; දකුණට : ආරෝග්‍යශාලාව, බස්නාහිරට : මන්නාරම-තල්වාපදු පාර.

8-291/ඒ.

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඒ දරණ ඡේදය යටතේ ප්‍රකාශනයයි

පළාත් පාලන සහ නිවාස ඇමතිවර මහානාම සමරවීර වන මම, 1958 අංක 42 දරණ පනතින් සංශෝධනය කරන ලද 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 ඒ. (1) (සී) ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මේ සමග ඇති උප ලේඛනයෙහි විස්තර කර ඇති ස්ථානය එම ඡේදයෙහි සඳහන් අරමුණ සඳහා අත්කර ගැනීමට අවශ්‍ය බව මෙයින් ප්‍රකාශ කරමි.

මහානාම සමරවීර,
පාලන් පාලන හා නිවාස ඇමති තුමා.

1962 ජූලි මස 27 වෙනි දින දීය,
කොළඹ 2.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඩපිල්ලි හත් පත්තුව ආදායම් පාලක නිලධාරී කොට්ඨාශයේ, මඩව පළාත ගම් මූලාදැනි වසමේ පිහිටි අඹවල සියඹලාගහමූලවත්ත නමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති අක්කරයක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක් :

උතුරට : කිරි සහ අනිකුත් අයට අයිති ඉඩමේ වැට; නැගෙනහිරට : අඹ පාර; දකුණට : අබේවෙල නමැති කුඹුර; බස්නාහිරට : කරුණාදාස සහ අනිකුත් අයට අයිති ඉඩමේ වැට.

8-291

---

## 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව

### 1962 ඡන්දදායක නාම ලේඛන සංශෝධනය කිරීම

1952 අංක 7 දරණ ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) සංශෝධන පනතින් සංශෝධිතවූ, 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාවේ 18 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, පාර්ලිමේන්තු මැතිවරණ කොමසාරිස් තැන්පත්, එඩ්වින් පිලික්ස් ඩයස් අබේසිංහ වන මම, 1962 ඡන්දදායක නාම ලේඛන සංශෝධනය සඳහා, ඉහත සඳහන් වගන්තියෙන් සකස් කිරීම අවශ්‍ය වී තිබෙන ලැයිස්තු, සියලුම මැතිවරණ කොට්ඨාශවල ලියාපදිංචි කිරීමේ නිලධාරීන් විසින් සම්පූර්ණ කළ යුතු අවසාන දිනය 1962 දෙසැම්බර් 31 වැනි දින බවට, මෙම දැන්වීමෙන් නියම කරමි.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
පාර්ලිමේන්තු මැතිවරණ කොමසාරිස්.

1962 අගෝස්තු මස 1 වැනි දින,
කොළඹදීය.

8-335

---

## නිවැරදි කිරීමයි

1962 ජූලි මස 27 වැනි දින අංක 13,230 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ I කොටසේ (I) ඡේදයේ 1100 වැනි පිටුවේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම්තුමා විසින් පළ කර ඇති කෘෂිකර්ම මධ්‍ය මණ්ඩලය සංස්ථාපනය පිළිබඳ දැන්වීමේ පළමුවෙනි ඡේදයේ මුද්‍රණ දෝෂ ඇති හෙයින් එය මෙසේ සංශෝධනය විය යුතුයි :

" අංක 9,773 හා 1947 සැප්තැම්බර් මස 24 වැනි දින දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළකරන ලද ප්‍රකාශනයෙන් මදක් වෙනස් කරනු ලැබූ කෘෂිකර්ම දෙපාර්තමේන්තු ආඥාපනතේ (ශීෂී 304) 4 වැනි වගන්තිය යටතේ තමන් වෙත පවරා ඇති බලතල අනුව කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ අමාත්‍යවරයා විසින් පහත සඳහන් නියෝජිතයන්ගෙන් සමන්විත කොට කෘෂිකර්ම මධ්‍ය මණ්ඩලය සංස්ථාපනය කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ. ".

7-964

---

# ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

I පරිශිෂ්ටය

## 1961 සැප්තැම්බර් 30 දිනට ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණයදෙන ආයතනයේ ශේෂ පත්‍රය

**වගකීම්**

| | රු. | ශ. | රු. | ශ. |
|---|---|---|---|---|
| මහා භාණ්ඩාගාර අත්තිකාරම් ... | | | 2,93,50,000 | 0 |
| පොදු සංචිත ගිණුම :— | | | | |
| පසුගිය වර්ෂයෙන් ගෙනා බැර ශේෂය... | 22,12,350 | 73 | | |
| ලාභාලාභ ගිණුමෙන් මාරු කළ මුදල... | 1,26,383 | 64 | | |
| | | | 23,38,734 | 37 |
| අනිශ්චිත අවස්ථා සංචිත ගිණුම :— | | | | |
| පසුගිය වර්ෂයෙන් ගෙනා බැර ශේෂය... | 3,38,123 | 72 | | |
| පොතෙන් අඩුකළ මුදල, හැර ... | 4,180 | 43 | | |
| | 3,33,943 | 29 | | |
| ලාභාලාභ ගිණුමෙන් මාරුකළ මුදල... | 31,595 | 91 | | |
| | | | 3,65,539 | 20 |
| අයබදු පිණිස වෙන්කළ මුදල ... | 5,55,394 | 52 | | |
| අනිකුත් සියළුම වගකීම් ... | 3,76,630 | 70 | | |
| ලාභාලාභ ගිණුම :— | | | | |
| පසුගිය වර්ෂයෙන් ගෙනා බැර ශේෂය... | 1,397 | 68 | | |
| රබර් පුනරුත්ථාපන (ණය) ක්‍රමය යටතේ මාරුකළ ශේෂය ... | 92 | 34 | | |
| | | (ix) කිරිකෙටු වැව විවිධ සේවා සමුපකාර සමිතිය |
| | | (x) කුන්චුට්ටුව විවිධ සේවා සමුපකාර සමිතිය |
| | | (xi) ටිකිරිහැන්දෑව විවිධ සේවා සමුපකාර සමිතිය |
| | | (xii) වත්තේ වැව විවිධ සේවා සමුපකාර සමිතිය |

| දිස්ත්‍රික්කය | නියමිත ප්‍රදේශය ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශය | ඒජන්ත කැන |
|---|---|---|
| | 2. කලාගම් පලාත ... | ... (i) අළුත්ගන්තිරියාගම විවිධ සේවා සමුපකාර සමිතිය |
| | | (ii) අමනක්කට්ටුව විවිධ සේවා සමුපකාර සමිතිය |
| | | (iii) අස්වැද්දුම විවිධ සේවා සමුපකාර සමිතිය |
| | | (iv) ඉපලෝගම ගන්තිරියාගම විවිධ සේවා සමුපකාර සමිතිය |
| | | (v) කදුරුවේගම විවිධ සේවා සමුපකාර සමිතිය |
| | | (vi) කාගම විවිධ සේවා සමුපකාර සමිතිය |
| | | (vii) කලාවැව විවිධ සේවා සමුපකාර සමිතිය |
| | | (viii) කරබැව විවිධ සේවා සමුපකාර සමිතිය |
| | | (ix) කෝනපතිරාව විවිධ සේවා සමුපකාර සමිතිය |
| | | (x) කුසලානගම විවිධ සේවා සමුපකාර සමිතිය |
| | | (xi) ආඬියාගල විවිධ සේවා සමුපකාර සමිතිය |
| | | (xii) බලලුවැව විවිධ සේවා සමුපකාර සමිතිය |
| | | (xiii) කහලපරවහගම විවිධ සේවා සමුපකාර සමිතිය |
| X. රත්නපුර ... | 1. නවදුන් කෝරළය ... | ... (i) බටුගෙදර ගොවි මණ්ඩලය |
| | | (i ) මාරපොන ගොවි මණ්ඩලය |
| | | (iii) දෙනවක පාතකඩ 1 ගොවි මණ්ඩලය |
| | | (iv) දෙනවක පාතකඩ 2 ගොවි මණ්ඩලය |
| | 2. අටකලන් කෝරළය ... | ... (i) කලල් ඇල්ල ගොවි මණ්ඩලය |
| | | (ii) අටකලන්පන්න ගොවි මණ්ඩලය |
| | | (iii) මාදම්පේ ගොවි මණ්ඩලය |
| | | (iv) හිරමඩගම ගොවි මණ්ඩලය |
| XI. කෑගල්ල ... | 1. දෙහිගම්පල් හා පාත බුලත්ගම | ... (i) වහරක ගොවි මණ්ඩලය |
| | | (ii) ඉඹුලාන ගොවි මණ්ඩලය |
| | | (iii) අම්තිරිගල ගොවි මණ්ඩලය |
| | | (iv) මාපිටිගම ගොවි මණ්ඩලය |
| | | (v) බෝපැත්ත ගොවි මණ්ඩලය |
| | | (vi) වැන්දල ගොවි මණ්ඩලය |
| | | (vii) යටියන්තොට ගොවි මණ්ඩලය |
| | | (viii) උඩුව ගොවි මණ්ඩලය |
| | | (ix) කිතුල්ගල ගොවි මණ්ඩලය |
| | | (x) කන්නන්තොට ගොවි මණ්ඩලය |
| | 2. බෙලිගල් කෝරළය ... | ... (i) කබගමුව ගොවි මණ්ඩලය |
| | | (ii) නාරන්ගොඩ ගොවි මණ්ඩලය |
| | | (iii) ඉඹුල්ගල ගොවි මණ්ඩලය |
| | | (iv) ආසිදෙනිය ගොවි මණ්ඩලය |
| | | (v) පෙහෙරඹේ ගොවි මණ්ඩලය |
| | | (vi) කොබ්බෑවල ගොවි මණ්ඩලය |
| | | (vii) හන්නාගොඩ ගොවි මණ්ඩලය |
| | | (viii) මකුද්දල ගොවි මණ්ඩලය |
| | | (ix) හැලියගොඩ ගොවි මණ්ඩලය |
| | | (x) ඇගල්ල ගොවි මණ්ඩලය |
| | | (xi) මොරවක ගොවි මණ්ඩලය |
| | | (xii) අක්වත්ත ගොවි මණ්ඩලය |
| | | (xiii) මංගෙදර ගොවි මණ්ඩලය |
| | | (xiv) තෝලන්ගමුව ගොවි මණ්ඩලය |
| | | (xv) බුරුන්නෑව ගොවි මණ්ඩලය |
| | | (xvi) ජාලත්කන්ද ගොවි මණ්ඩලය |
| | | (xvii) දදිගම ගොවි මණ්ඩලය |
| | | (xviii) පල්ලේගම ගොවි මණ්ඩලය |
| | | (xix) මල්මඩුව වේරගල ගොවි මණ්ඩලය |

8-399/5

---

## රථවාහන ගමනාගමනයට බාධා

**දකුණු කොළඹ දිස්ත්‍රික්කයේ, කෝට්ටෙ-බෝපේ පාර**

ඉහත සඳහන් මාර්ගයේ ඇතුල් කෝට්ටෙ හන්දියේ සිට බත්තර මුල්ල හන්දිය දක්වා කොටස, 62.8.17 වෙනි දින සිට 62.10.22 වෙනි දින දක්වා, රථ වාහන ගමන් කළ නොහැකි වන සේ වසා තබන බැව් මහා ජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

වැලිකඩ හා කලපලුවාව මාර්ගය ඒ වෙනුවට යොදාගත හැකිය.

ඒ. සී. පෙරේරා,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

1962 අගෝස්තු මස 2 වෙනි දින,
කොළඹ, රජයේ වැඩ කාර්යාලයේ දීය.

8-320

## දැන්වීමයි

**කො/විද්‍යාවංශ පිරිවෙන, බණ්ඩාරවත්ත, ගම්පහ**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, ගම්පහ, බණ්ඩාර වත්තෙ පිහිටි ඉහත සඳහන් පිරිවෙන ආධාර ලබන පිරිවෙනක් ලෙස තාවකාලික වශයෙන් 2.1.1961 දින සිට ලියාපදිංචි කළ බව මෙයින් දන්වමි.

ඇස්. ඇෆ්. ද සිල්වා,
අධ්‍යාපන අධ්‍යක්ෂ.

ඊ. එස්. බී. 36,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ය.
3. 8. 1962.

8-360

## දැන්වීමයි

**කලු/අභයරාජ පිරිවෙන—නාරවිල**

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ බටහිර පස්යොදුන් කෝරළේ ඉද්දගොඩ පත්තුවේ නාරවිල පිහිටි ඉහත සඳහන් පිරිවෙන රජයේ ආධාර ලබන පිරිවෙනක් ලෙස ලියා පදිංචි කිරීමට කළුවාමෝදර සුගතවිමල ස්ථවිරයන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ. මේ දැන්වීම ප්‍රසිද්ධ කළ දිනයේ සිට තිස් දවසක් ඇතුළත මේ ඉල්ලීමට විරුද්ධතාවයක් ඇති නම් මා වෙත දැන්විය යුතුයි

ඇස්. ඇෆ්. ද සිල්වා,
අධ්‍යාපනාධ්‍යක්ෂ.

ඊ. එස්. බී. 28,
1962 ජූලි මස 30 වැනි දින,
කොළඹ 2, මැලේ වීදිය,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදීය.

8-266

---

## "සුරාබදු ආඥපණත" පිළිබඳ දැන්වීම්

ඇල්. ඕ.—බී. 16/37.

**සුරාබදු ආඥපනත**

**අංක 501 දරන සුරාබදු නිවේදනය**

1962 සැප්තැම්බර් මස 30 දින සිට හා පසුව සෑම සුරාබදු බලපත්‍රයන්වම අදාල පොදු කොන්දේසි මාලාව.

සුරබාදු ආඥපනතේ (52 වෙනි අධිකාරය) 25 වෙනි වගන්තිය යටතේ කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිතුමාගේ නියමය පරිදි,

(1) මෙහි පහත සඳහන් උපලේඛනයෙහි දක්වා ඇති කොන්දේසි 1962 සැප්තැම්බර් මස 30 වෙනි දින සිට, තවදුරටත් දැනුම් දෙනතුරු සෑම සුරාබදු බලපත්‍රයටම අදාල වියයුතු පොදු කොන්දේසි හැටියට ද,

(2) 1961 මැයි මස 6 වෙනි දින හා අංක 12,402 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පලවූ අංක 491 සුරාබදු නිවේදනය 1962 සැප්තැම්බර් මස 30 වෙනි දින සිට අවලංගු කරනු ලැබිය යුතු ලෙසද, මෙයින් නිවේදනය කරනු ලැබේ.

වී. ඇල්. වීරසිංහ,
කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1962 ජූලි මස 27 වැනි දින,
කොළඹ දීය.

### උපලේඛනය

**1. තැබෑරුම් ගොඩනැගිලි පිළිබඳ කොන්දේසි : ගොඩනැගිල්ලක් කඩා වෙනස් කිරීම සඳහා ආණ්ඩුවේ දිසාපතිගේ අනුමතිය ලබා ගැනීම :—**

(1) තැබෑරුම්වලදී (මෙරට බීම හෝ පිටරට බීම) විකිණිය යුත්තේ සුදුසු ගොඩනැගිල්ලක තබාගෙනය. ඒ මුළු ගොඩනැගිල්ලම හෝ එහි කොටසක් හෝ තැබෑරුමක් වශයෙන් පාවිච්චි කිරීම සඳහා වෙනම ම වෙන්කොට තැබිය යුතුය. තැබෑරුමත් ඊට යාව පිහිටි (මිනිසුන් පදිංචි) ගෙයකුත් අතර දොර ජනෙල් ආදී යම්කිසිවක් තිබෙතොත් ඒවා සෑම විටම වසා තැබිය යුතුය. කිසිම තැබෑරුමකට ඇතුළුවීමට හෝ ඉන් පිටවීමට ඉදිරිපස දොර හැර අන්කිසි දොරක් නොතිබිය යුතුය. තැබෑරුම ඇතුළේ දිවා රෑ දෙක්හිම සෑහෙන තරම් එළිය තිබිය යුතුය. රේන්දකරු විසින් හෝ මුරකරුවකු මෙන් කටයුතු කරන බලය ලත් සේවකයකු විසින් හැර අන් කවරකු විසින් වත් තැබෑරුම පදිංචි ස්ථානයක් වශයෙන් පාවිච්චි නොකළ යුතුය. තැබෑරුමේ බිත්ති පොල්අතුවලින් සාද නොතිබිය යුතුය.

(2) ආණ්ඩුවේ දිසාපතිගේ අනුමතිය නැතිව තැබෑරුම් ගොඩනැගිල්ලකට කිසිම වෙනසක් කිරීම හෝ අමුතුවෙන් කෑල්ලක් ගැනීම හෝ කිසිම තාප්පයක් හෝ වැටක් හෝ වෙනයම් කොටුවක් බැඳීම හෝ නොකට යුතුය.

(3) යම්කිසි තැබෑරුමක් පෞද්ගලික ආපාන පීඨිකාවක් (බාර් එකක්) පිහිටුවීම සඳහා නොමිලයේ දෙන විශේෂ බලපත්‍රයකින් තමාගේ කල්පනාවේ හැටියට අවසර දීමට ආණ්ඩුවේ දිසාපතිට බලය තිබේ. එසේ බලය දියහැක්කේ ඒ ආපාන පීඨිකාවේ ඇති ලී බඩු හා උපකරණද තැබෑරුම පිහිටා තිබෙන ප්‍රදේශයද ඊට සෑහේයයි ඒ මහතාට හැඟුණොත් පමණකි. එහෙත් ඒ ආපාන පීඨිකාවට ඇතුළුවන දොරටුව ළඟ සිට බලනවිට ඒ ආපාන පීඨිකාව සම්පූර්ණ වශයෙන් පෙනියන පරිදි තිබිය යුතුවා පමණක් නොව ඒ ආපාන පීඨිකාවට ඇතුළුවීම ප්‍රධාන දොරටුවෙන්ම හෝ ඒ ආපාන පීඨිකාවේ ස්වභාවය පැහැදිලිව දක්වන සංඥා පුවරුවක් සවිකොට හෝ ගසා ඇති වෙනම දොරක් වීමද අවශ්‍යය.

**2. බලපත්‍ර ලත් ස්ථානවල සංඥා පුවරු ගැසීම.**—බලපත්‍ර ලත් ඉස්කාගාර, සෙසු මත්පැන් වර්ගයක් සාදන ස්ථාන, මත්පැන් පෙරන ස්ථාන, තොග සුරා ගබඩාවල්, අරක්කු රේන්ද කරුවන්ගේ සුරා ගබඩාවල්, සුරා බෝතල්වලට අහුරන ගුදම්, මෙරට බෙහෙත් ඉස්පිරිතු හෝ පලතුරුවලින් පෙරන මත්පැන් හෝ පොල් වලින් පෙරන මත්පැන් විකිණීමට බලපත්‍ර ලත් ස්ථාන, රටබීම සාප්පු, බෙහෙත් වයින් සාප්පු, පරිපාක ඉස්පිරිතු සාප්පු, ආපනශාලා, කැන්ටිම් (බීර හා පෝටර පමණක් විකිණීම සඳහා බලපත්‍ර ලත් ස්ථානද ඇතුළු) තැබෑරුම් යන මේ කොයි එකකවූවත් ඉදිරියෙහි බලපත්‍රයේ අංකය හා ස්වභාවයත්, බලපත්‍ර ලාභියාගේ නමත්, මෙරට බීම කැන්ටිම් හෝ තැබෑරුම් සම්බන්ධයෙන් වූවිට නම් විකුණන මිල ගණනද සඳහන් සංඥා පුවරුවක් සවිකළ යුතුය. මේ තොරතුරු කාටත් කියවිය හැකි පරිදි පැහැදිලි ලෙස සිංහලෙන් හා දෙමළෙන් පින්තාරුකර තැබිය යුතුය. බලපත්‍රයත් සිංහල, දෙමළ, ඉංග්‍රිසි යන භාෂාත්‍රයෙන්ම මුද්‍රිත මේ කොන්දේසි මාලාවේ පිටපතත් බලපත්‍ර ලත් හැම ස්ථානයක්ම ඇතුළත කාටත් පෙනෙන පරිදි ප්‍රදර්ශනය කළ යුතුය.

**3. (1) බලපත්‍ර ලත් මත්පැන් වර්ගය හැර වෙන මත්පැන් වර්ගයක් ළඟ තබාගැනීමේ තහනම.**—බලපත්‍රයේ සඳහන් වන මත්පැන් වර්ගය හැර වෙනයම් මත්පැන් වර්ගයක් හෝ මද්‍ය ඖෂධයක් හෝ මත්පැන් වර්ණවත් කිරීමට හෝ රසවත් කිරීමට පාවිච්චි කරනු ලබන හෝ පාවිච්චි කළ හැකි යම් සාරයක් හෝ ද්‍රව්‍යයක් වූකලී සුරාබදු කොමසාරිස් විසින් දෙන ලද විශේෂ බලපත්‍රයක් යටතේ මිස නැත්නම් බලපත්‍ර ලත් මොනම ස්ථානයකවත් තබා ගැනීම තහනම්ය. එහෙත් මත්පැන් වර්ණවත් කිරීමට හෝ රසවත් කිරීමට කල්දේරම් මඩුවල තබාගන්නාවූ හෝ පාවිච්චි කරන්නාවූද ශරීරයට අහිතවත් නොවන්නාවූද ද්‍රව්‍ය සුරාබදු කොමසාරිස් විසින් අනුමත කරන ලද්දේ නම් ඒ ද්‍රව්‍ය සම්බන්ධයෙන් මේ කොන්දේසියේ පූර්වෝක්ත විධිවිධාන අදාළ නොවිය යුතුය.

(2) **මත්පැන් බාලකර විකිණීමේ තහනම.**—(අ) බලපත්‍ර ලත් ස්ථානවල, බලයලත් ගබඩාවල, ගුදම් හා එකතුකිරීමේ ස්ථානවල විකුණනු ලබන හෝ විකිණීමට තබා ඇති සියළු මත්පැන් වර්ග හා මද්‍ය ඖෂධ වර්ග හොඳ විය යුතුය. කලවම් නැති විය යුතුය. යම්කිසි මත්පැනක මද්‍ය බලය වැඩිකිරීමටවත් වෙනයම් කරුණක් සඳහාවත් ඊට කිසිවක් මිශ්‍ර නොකළ යුතුය. එහෙත් මත්පැන් වර්ණවත් කිරීමට හෝ රසවත් කිරීමට ඉස්කාගාරයන්හි තබාගනු ලබන හෝ පාවිච්චි කරනු ලබන හා ශරීරයට අහිතවත් නොවන ද්‍රව්‍ය සුරාබදු කොමසාරිස් විසින් අනුමත කරන ලද්දේ නම් ඒ ද්‍රව්‍ය සම්බන්ධයෙන් මේ කොන්දේසියේ පූර්වෝක්ත විධිවිධාන අදාළ නොවිය යුතුය.

(ආ) යම් මත් පැනක් බාල කරන ලද බවට හෝ හොඳ තත්වයේ මත්පැන් නොවන බවට හෝ ආණ්ඩුවේ රස පරීක්ෂක විසින් අත්සන්කර ඇති වාර්තාවක් මේ කොන්දේසියේ කාර්යයන් සඳහා තීරණාත්මක සාධක වශයෙන් පිළිගනු ලැබිය යුතුය.

(3) **මත්පැන් විකුණන මිල.**—සංඥා පුවරුවෙහි සඳහන් වන මිල ගණනට වඩා වැඩි මිලකට කිසිම මත්පැනක් මෙරට මත්පැන් කැන්ටිම්වල හෝ තැබෑරුම්වල හෝ විකිණිය යුතු නොවේ. ඒ ඒ දවසේ කැන්ටිම හෝ තැබෑරුම විවෘත කරන වේලාවට කලින් "අද මත්පැන්වල මිල මෙපමණය" කියා නියම කරගත යුතුවාත් හැර එකී මිල ඒ දවස ඇතුළතදී වෙනස් නොකළ යුතුද වන්නේය.

**4. සේවකයන් පිළිබඳ අනුමැතිය.**—ගුදම්, ගබඩා, තැබෑරුම්, වතුවල තිබෙන අරක්කු හා රා කැන්ටින්, විනාකිරි ගබඩා, රා අතුරු, රා එකතු කරන ස්ථාන, ආපාන පීඨිකාවන් තබා ගැනීමට අවසර ඇති ආපනශාලා, හෝටල්, බලපත්‍ර ලත් රටබීම සාප්පු යන මේවායේ සේවයට ගැනීමට අදහස් කරන සියලු දෙනාගේ නම් හා ලිපිනයන් සුරාබදු අධිකාරි වෙත ලියා යැවිය යුතුය. එවිට ඔවුන් අතුරෙන් තමා අනුමත කරන අය සේවයට ගැනීමට බලය දී අවසර පත්‍රයක් ඔහු විසින් එවනු ලැබේ. ඒ අවසර පත්‍රය ඒ අය සේවය කරන (බලපත්‍ර ලත්) ස්ථානයේ කාටත් පෙනෙන තැනක ගසා තැබිය යුතුය. කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම්ගේ බලය මත පමණක් ලංකා පුරවැසියන් නොවන අයකු සේවයට ගනු විනා, එවැනි බලපත්‍ර නිකුත් කරනුයේ ලංකා පුරවැසියන්ට පමණි. එසේ බලය ලත් අය නිසි පරිදි පිරිසිදු ඇඳුමින් සැරසී සිටිය යුතුය. එසේ බලය නුදුන් කිසිවකු කිසිම බලපත්‍ර ලත් ස්ථානයක සේවයට නොගත යුතුය. මේ කොන්දේසිය යටතේ දෙන ඕනෑම අවසර පත්‍රයක් ඕනෑම වේලාවකදී අවලංගු කිරීමට සුරාබදු අධිකාරීට බලය පැවරී ඇත.

**5. සේවයට ගත නොහැකි අය.**—පහත සඳහන් අය විසින් මත්පැන් හෝ මද්‍ය ඖෂධ වර්ග සෑදීම හෝ එකතු කිරීම හෝ විකිණීම හෝ ගෙනයෑම තහනම්ය. එසේම ඔවුන් ඒවා සෑදීම, එකතු කිරීම, විකිණීම හෝ ගෙනයාම සඳහා සේවයට ගැනීමද තහනම්ය :—

(i) ලාදුරු රෝගයෙන් හෝ යම්කිසි වසංගත රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් පෙළෙන අය ;

(ii) සුරාබදු බලපත්‍ර දැරීම හෝ සුරාබදු බලපත්‍රධාරීන් යටතේ සේවය කිරීම හෝ තහනම් කරනු ලැබූවන්ගේ ලැයිස්තුවට නම් ඇතුලත් වී ඇති අය ;

(iii) මිට ඉහත අවුරුදු දෙක තුළ සුරාබදු පිළිබඳ ඕනෑම වරදකට වරදකරුවන් වූ අය හෝ තුන් වතාවකට වැඩියෙන් සුරාබදු වරදවලට වරදකරුවන් වූ අය ;

(iv) අපරාධ චැළැක්වීමේ ආඥාපනතෙහි (18 වැනි අධිකාරය) අර්ථය ඇතුළත් අපරාධ කරුවන් වන අය ;

(v) වයස අවුරුදු විසිඑකකට අඩු පිරිමි හා කොයි වයසක වුවත් ගැහැණු.

6. **විවෘත කිරීමේ සහ වැසීමේ වේලාවල් : (1) රා තැබෑරුම්.**—රා තැබෑරුම් පෙරවරු 8 පටන් පස්වරු 6.30 වනතෙක් විවෘතව තැබිය යුතුය. සෙසු සියලු වේලාවලදී වසා තැබිය යුතුය. එතෙකුදු වුවත් ආණ්ඩුවේ දිසාපතිට සුරාබදු උපදේශක සභාවේ අදහස් විමසීමෙන් පසු සාමාන්‍යයෙන් යම්කිසි ප්‍රදේශයක පිහිටි සියලු තැබෑරුම් හෝ යම්කිසි ප්‍රදේශයක පිහිටි විශෙෂ තැබෑරුමක්—

(අ) නියමිත වේලාවට වඩා ප්‍රමාදවී විවෘත කිරීමට නියම කිරීමට; හා

(ආ) නියමිත වේලාවට කලින් වැසීමට නියම කිරීමට ; හා

(ඇ) විවෘත කරන වේලාව හා වහන වේලාව අතර මේ කාල පරිච්ඡෙදය තුළ හෝ මේ මේ කාල පරිච්ඡෙදයන් තුළ තැබෑරුම් වසා තැබිය යුතුයයි නියම කිරීමට ; හා

(ඈ) ප්‍රාදේශීය තත්ත්වයන් හේතුකොටගෙන නගරයක් ඇතුළත හෝ ඉන් පිටත, සහ විශේෂ අවස්ථාවන්හි දී නගරයකින් පිටත, (පෙරවරු 7.00ට කලින් නො විය යුතු) කලින් විවෘත කරන වේලාවක් හා (ඒ ප්‍රදේශයෙහි අරක්කු තැබෑරුම් වසන වේලාවෙන් පසුව නො විය යුතු) ප්‍රමාදවී වසන වේලාවක් ද නියම කිරීමට; හා

(ඉ) ඉරිදා දවස්වලදී ආගමික ප්‍රතිපත්ති පුරණ සෙසු දිනවලදී මුළු දවස හෝ පැ ගණනකින් යුත් නියමිත කාල පරිච්ඡෙදයක් හෝ කාල පරිච්ඡෙදයන් තුළ බලපත්‍රකාරයාගේ ඉල්ලීම පිට තැබෑරුම වසා තැබීමට අවසර දීමට හෝ එබඳු ඉල්ලීමක් නැතිව තැබෑරුම වසා තැබීමට කෙලින්ම නියම කිරීමටත් ;

බලය ඇත්තේය. රා තැබෑරුමක් විවෘතකොට තැබිය හැකි වේලාව බලපත්‍රයෙහි සඳහන් කළ යුතුය. ඒ වේලාවේදී මිස අන් කිසි වේලාවකදී රා විකිණිය යුතු නොවේ.

(2) **අරක්කු තැබෑරුම්.**—අරක්කු තැබෑරුම් පෙරවරු 8 පටන් පස්වරු 6.30 තෙක් විවෘතකොට තැබිය යුතුය. සෙසු සියලු වේලාවලදී වසා තැබිය යුතුය. එතෙකුදු වුවත් ආණ්ඩුවේ දිසාපතිට සුරාබදු උපදේශක කාරක සභාවේ අදහස් විමසීමෙන් පසු සාමාන්‍යයෙන් යම්කිසි ප්‍රදේශයක පිහිටි සියලු තැබෑරුම් හෝ යම්කිසි ප්‍රදේශයක පිහිටි තැබෑරුමක්—

(අ) නියමිත වේලාවට වඩා ප්‍රමාදවී විවෘත කිරීමට නියම කිරීමට ; හා

(ආ) නියමිත වේලාවට කලින් වැසීමට නියම කිරීමට ; හා

(ඇ) විවෘත කරන වේලාව හා වහන වේලාව අතර මේ කාල පරිච්ඡෙදය හෝ මේ මේ කාල පරිච්ඡෙදයන් තුළ තැබෑරුම් වසා තැබිය යුතුයයි නියම කිරීමට ; හා

(ඈ) ප්‍රාදේශීය තත්ත්වයන් හේතුකොටගෙන නගරයක් ඇතුළත හෝ ඉන් පිටත සහ විශේෂ අවස්ථාවන්හි දී නගරයකින් පිටත (කිසිම අවස්ථාවකදී පස්වරු 9 ට පසුව නො විය යුතු) ප්‍රමාද වී වසන වේලාවක් නියම කිරීමට ; හා

(ඔ) ඉරිදා දවස්වලදී හෝ ආගමික ප්‍රතිපත්ති පුරණ සෙසු විශෙෂ දිනවලදී මුළු දවස හෝ පැ ගණනකින් යුත් නියමිත කාල පරිච්ඡෙදයක් හෝ කාල පරිච්ඡෙදයන් තුළ බලපත්‍රලාභියාගේ ඉල්ලීම පිට තැබෑරුම වසා තැබීමට අවසර දීමට හෝ එබඳු ඉල්ලීමක් නැතිව තැබෑරුම වසා තැබීමට කෙලින්ම නියම කිරීමටත් ;

බලය ඇත්තේය. අරක්කු තැබෑරුමක් විවෘත කොට තැබිය හැකි වේලාව බලපත්‍රයෙහි සඳහන් කළ යුතුය. ඒ වේලාවලදී මිස අන් කිසි වේලාවකදී අරක්කු විකිණිය යුතු නොවේ.

(3) **රටබීම විකුණන ස්ථාන.**—රටබීම විකිණීමට බලය ලත් සථාන, ආණ්ඩුවේ දිසාපති විසින් බලපත්‍රයෙහි සඳහන් කොට ඇති විවෘත කරන වේලාවත් වහන වේලාවත් අතර කාලය තුළදී විවෘතකොට තැබිය යුතුය. සෙසු සියලු වේලාවලදීම වසා තැබිය යුතුය.

එතෙකුදු වුවත්, 1931 අප්‍රේල් මස 17 වැනි දිනය හා අංක 7,845 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළවූ 218 වැනි සුරාබදු නිවේදනයෙන් විවෘත කරන හා වහන වේලාවල් නියමකොට ඇත්තාවූ සථානයන් සම්බන්ධයෙන් ඒ නියම කරනලද වේලාවල් අදාළ වේ; (බීර හා පෝටර පමණක් විකිණීමට බලපත්‍රලත් සථානද ඇතුළු) රටබීම තැබෑරුම් වසන වේලාව ඒ ප්‍රදේශයෙහිම පිහිටි අරක්කු තැබෑරුම් වසන වේලාවට වඩා ප්‍රමාද නොවිය යුතුය. තවද ආණ්ඩුවේ දිසාපතිට සුරාබදු උපදේශක සභාවේ අදහස් විමසීමෙන් පසු සාමාන්‍යයෙන් යම්කිසි ප්‍රදේශයක පිහිටි (බීම විකුණන) සියලු ස්ථානයන් හෝ යම්කිසි ප්‍රදේශයක පිහිටි (බීම විකුණන) විශෙෂ සථානයක්—

(අ) විවෘත කරන වේලාව වහන වේලාව අතර මේ කාල පරිච්ඡෙදය තුළ හෝ මේ මේ කාල පරිච්ඡෙදයන් තුළ වසා තැබිය යුතුයයි නියම කිරීමට ;

(ආ) ඉරිදා දවස්වලදී ආගමික ප්‍රතිපත්ති පුරණ සෙසු විශෙෂ දිනවලදී මුළු දවසම හෝ පැ ගණනකින් යුක්ත නියමිත කාල පරිච්ඡෙදයක් හෝ කාල පරිච්ඡෙදයන් තුළ බලපත්‍රලාභියාගේ ඉල්ලීම පිට ඒ ස්ථානය වසා තැබීමට අවසර දීමට හෝ එබඳු ඉල්ලීමක් නැතිව ඒ ස්ථානය වසා තැබීමට කෙලින්ම නියම කිරීමට ;

බලය ඇත්තේය. තවද යම්කිසි විශේෂ අවස්ථාවකදී ආණ්ඩුවේ දිසාපතිට ස්වකීය අභිමතය පරිදි තැබෑරුම් හෝ බීර හා පෝටර පමණක් විකිණීමට බලපත්‍ර ලත් සථානයන් හැර ඕනෑම බලපත්‍ර ලත් සථානයක් නියමිත වේලාවෙන් පසු තමා නියම කරන යම් වේලාවක් වනතෙක් විවෘතකොට තැබීමට හෝ බලපත්‍රලාභියාගේ ඉල්ලීම පිට දවස් 30 වැඩි නොවන කාල පරිච්ඡෙදයක් තුළ තාවකාලික වශයෙන් වසා තැබීමට හෝ ඉඩදීමට බලය ඇත්තේය.

රටබීම විකිණීම සඳහා බලපත්‍රයක් ලත් සථානයක් විවෘතකොට තැබිය හැකි වේලාව බලපත්‍රයෙහි සඳහන් කළ යුතුය. ඒ වේලාවලදී හැර අන් කිසි වේලාවකදී රටබීම එහිදී විකිණිය යුතු නොවේ.

7. **වෙරිවීම, කලකෝලාහල කිරීම සූදු කෙළීම.**—බලපත්‍ර ලත් කිසිම සථානයක කිසිවකුට වෙරිවී සිටීමට හෝ කලකෝලාහල කිරීමට හෝ සූදු කෙළීමට හෝ ඉඩ නොදිය යුතුය. මත්පැන් විකිණීමට බලපත්‍රයක් ලත් සෑම පුද්ගලයකුම හා බලපත්‍රයක් ලත් සථානයක් භාරව සිටින සෑම පුද්ගලයකුම විසින් වෙරිවූ හෝ රෞද්‍ර ස්වභාවයට පත්වූ හෝ කලකෝලාහල කරන හෝ නොහික්මුණු ලෙස හැසිරෙන කිසිවකුත් බලපත්‍ර ලත් ස්ථානයට පැමිණීමෙන් එවකට වලංගු වන යම් ආඥාපනතක් යටතේ දඬුවමකට භාජන වන කිසිවකුත් ඒ සථානයට වැද්ද නොගත යුතුවා පමණක් නොව, ඒ ස්ථානයෙන් බැහැරට යැවිය යුතුවාත් හැර එබඳු කිසිවකුට කිසිම මත්පැනක් විකිණීමද නොකළ යුතුය.

8. **කොයිම වේලාවකදීවත් වැද්ද නොගත යුතු අය.**—මං පහරන්නන් නොහොත් හොරුන්, පෙරළිකරන්නන් නොහොත් කැරළිගසන්නන්, වෛශ්‍යාවන් වශයෙන් අපකීර්තිය පත් ස්ත්‍රීන්, අපරාධ වැළැක්වීමේ ආඥාපනතෙන් (18 වැනි අධිකාරයෙන්) අදහස් කරන පරිදි ලියාපදිංචි කළ අපරාධකාරයන් යන මොවුන්ගෙන් කවරකුවත් බලපත්‍රයක් ලත් කිසිම ස්ථානයකට වැද්ද නොගත යුතුය. බලපත්‍රයක් ලත් මොනම ස්ථානයකවත් එබඳු අයකු ගැවසුනොත් ඒ බව කිව්වුවෙන්ම සිටින මහේස්ත්‍රාත්වරයාට හෝ පොලිස් නිලධාරියාට දැන්වීම බලපත්‍රකාරයාගේ යුතුකම විය යුතුය.

9. **බලපත්‍රයක් ලත් සථානයක් වැහුවාට පසු ඊට කිසිවකු වැද්ද නොගත යුතු බව.**—බලපත්‍රයක් ලත් යම්කිසි ස්ථානයක් වැහුවාට පසු නැවත ඒ සථානය විවෘත කරන තුරු හෝ ඒ සථානය වසා තබන මොනම කාල පරිච්ඡෙදයක් අතරතුර හෝ කිසිවකු ඒ ස්ථානයට වැද්ද නොගත යුතුය. තවද රාජකාරියෙහි යෙදී සිටින අතර කිසිම පොලිස් භටයකු (කොස්තාපල් කෙනෙකු) ඒ ස්ථානයට වැද්ද නොගත යුතුය.

10. (1) **තැබෑරුම් හා සෙසු බලපත්‍ර ලත් සථාන වෙසක් උත්සවය සඳහා වැසීම.**—පහත සඳහන් යම්කිසි බලපත්‍රයක් දරන හැම අයකු විසින් ඒ බලපත්‍රය ලත් සථානය වෙසක් මාසයේ පුර පසළොස්වක්දා වැසිය යුතුය. එසේම ඒ දවසේදී ඒ සථානය වැසීම හේතු කොටගෙන ඇතිවන යම්කිසි පාඩුවක් හෝ අලාභයක් වෙනුවෙන් වන්දි ඉල්ලීමට ඔහුට අයිතිවාසිකමක් නොතිබිය යුතුවා පමණක් නොව, ඔහු විසින් එසේ වන්දි ඉල්ලීමක් ද නොකළ යුතුය :—

(අ) සථානයෙන් පිටතට ගෙන්හොස් පාවිච්චි කිරීම සඳහා සිල්ලරට රටබීම විකිණීම සඳහා දෙන බලපත්‍ර ;

(ආ) රටබීම තැබෑරුමක් සඳහා දෙන බලපත්‍ර ;

(ඇ) අරක්කු තැබෑරුමක් සඳහා දෙන බලපත්‍ර ;

(ඈ) රා තැබෑරුමක් සඳහා දෙන බලපත්‍ර ;

(ඉ) බීර, ඒල්, ස්ටවුට්, පෝටර් යන මේ බීම විකිණීම සඳහා දෙන බලපත්‍ර ;

(ඊ) මෙරට සාදන බීර, ඒල්, ස්ටවුට්, පෝටර් යන මේ බීම විකිණීම සඳහා දෙන බලපත්‍ර ;

(උ) ආපන ශාලාවක හෝ රෙස්ටෝරන්ට් ශාලාවක මත්පැන් විකිණීම සඳහා දෙන බලපත්‍ර ;

(ඌ) හෝටලයක ආපන පිහිකාවක් තබාගැනීම සඳහා දෙන බලපත්‍ර ;

(එ) (මෙරට සාදන ධාන්‍ය මත්පැන් ද ඇතුළුව) රටබීම විකිණීම සඳහා යම් යම් උත්සව අවස්ථාවන්හිදී දෙන බලපත්‍ර ;

(ඒ) හෝටලයක හෝ නේවාසිකාගාරයක හෝ නේවාසිකයන්ට මත්පැන් සැපයීම සඳහා දෙන බලපත්‍ර ;

(ඔ) ප්‍රසිද්ධ විනෝද සථානයක් පිළිබඳව මත්පැන් විකිණීම සඳහා නිකුත් කරන ලද බලපත්‍ර ;

(ඕ) නාන්‍යායමක් ඇතුළත මත්පැන් විකිණීම සඳහා දෙන බලපත්‍ර ;

(ක) අරක්කු විකිණීම සඳහා දෙන වතු කැන්ටීම් බලපත්‍ර ; සහ

(ග) රා විකිණීම සඳහා දෙන වතු කැන්ටීම් බලපත්‍ර.

එතෙකුදු වුවත්, මත් පැන් විකිණීමට අතිරේක වශයෙන් යම්කිසි බලපත්‍ර ලත් ස්ථානයක වෙන යම් ව්‍යාපාරයක් කරගෙන යනු ලැබේ නම්, එම ස්ථානය එකී ව්‍යාපාරය සඳහා විවෘතව තබා ගත හැකිය. එහෙත් එදින මත් පැන් විකිණීම හෝ මත් පැන් විකිණීම පිණිස ඉදිරිපත් කිරීම හෝ නොකට යුතුය.

**(2) විශේෂ හේතූන් නිසා තැබෑරුම් හා සෙසු බලපත්‍ර ලත් ස්ථාන වැසීම.**—නාවිකයන්ගේ හෝ භටයන්ගේ රෙජමේන්තුවක්, හෝ හමුදාවක් සමීපයෙහි කඳවුරු බැඳ සිටිනවිට හෝ ගමන් කරන විට ඒ ගමන් මාර්ගයෙහි හෝ ඒ සමීපයෙහි පිහිටි තැබෑරුම් ආණ්ඩුවේ දිසාපති නියම කළහොත් වැසිය යුතුය. එසේම ආගමික උත්සව සහ විශේෂ ආගමික චාරිත්‍ර විධි පැවැත්වීම්වලදී හෝ ආගමික කටයුතු පිළිබඳ කලබලයක් පවත්නා විට හෝ ඡන්ද විමසීමක් පවත්වන දිනවලදී හෝ අරගලයක් ඇතිවී තිබෙන විට හෝ අරගලයක් ඇතිවෙතැයි සැකයක් පහළවී තිබෙන විට, ආණ්ඩුවේ දිසාපති නියම කළොත් බලපත්‍රලත් ඕනෑම ස්ථානයක් තාවකාලිකව වැසිය යුතුය.

සමීපයෙහි කැරළි කෝලාහලයක් හෝ අරගලයක් පවතින විට සුරාබදු බලපත්‍රධාරීකවරකු විසින් වුවත් සිය කැමැත්තෙන්ම තමාගේ (බලපත් ලත්) ස්ථානය වැසිය යුතුය. එසේ වැසීම නිසා ඇතිවන කිසිම හානියක් හෝ අලාභයක් වෙනුවෙන් වන්දි ඉල්ලීමට බලපත්‍රලාභියාට හිමිකමක් නොතිබිය යුතුවාත් පමණක් නොව, ඔහු විසින් වන්දි ඉල්ලීමක් ද නොකළ යුතුය.

**11. තුරඟ තරඟ හා මහජන විනෝද ක්‍රීඩාදිය වෙනුවෙන් ඒ ඒ උත්සව අවස්ථා සඳහා දෙන බලපත්‍ර.**—තමා අනුමත කරන තුරඟ තරඟ හෝ පොදු විනෝද ක්‍රීඩා ගහ් සෙසු රැස්වීම් ආදිය පවත්වන විට තදනුබද්ධ ආපන ශාලාවල හෝ ආපන පිඩිකාවල ඒ ඒ අවස්ථාවන්හි දී පිටරට බීම විකිණීම සඳහා තමා අනුමත කරන යම්කිසි අයකුට බලපත්‍ර දීමේ බලය ආණ්ඩුවේ දිසාපති කෙරෙහි පැවරී ඇත්තේ ය. සුරාබදු කොමසාරිස්ගේ අභිමතය පරිදි අරක්කු සහ රා විකිණීම සඳහා උත්සව අවස්ථා බලපත්‍ර නිකුත් කරනු ලැබේ. යම්කිසි උත්සව අවස්ථාවක් සඳහා බලපත්‍රයක් දියහැකි කාලපරිච්ඡේදය දවස් 10කට වැඩි නොවිය යුතුය. ඒ සඳහා ගෙවිය යුතු ගාස්තුව වූ කලී උත්සව අවස්ථාවේ හැටියට ආණ්ඩුවේ දිසාපති විසින් හෝ සුරාබදු කොමසාරිස් විසින් ස්වකීය අභිමතය පරිදි නියම කළ යුතුය.

**12. මත් පැන් නොවිකිණිය යුත්තේ නොහොත් නොදිය යුත්තේ කොබඳු අයටද යන වග.**—කිසිම මත් පැන් වර්ගයක්—

(අ) (1) ලංකා යුද්ධ හමුදාව සම්බන්ධයෙන් නම් එහි සේනාධිපති විසින් ද ;

(2) ලංකා රාජකීය නාවික හමුදාව සම්බන්ධයෙන් නම් එහි කපිතාන් විසින් ද ;

(3) ලංකා ගගන හමුදාව සම්බන්ධයෙන් නම් එහි සේනාධිපති විසින් ද ;

(4) යම්කිසි ආගන්තුක හමුදාවක් සම්බන්ධයෙන් නම් එය මෙහෙයවන සේනාධිපති විසින් ද ;

නොවැද්දගත යුතුයයි ලියවිල්ලකින් නම් කරන ලද බලපත්‍ර ලත් ස්ථානවලදී ලංකා යුද්ධ හමුදාවේ හෝ ලංකා රාජකීය නාවික හමුදාවේ හෝ ලංකා ගගන හමුදාවේ හෝ 1949 අංක 31 දරන ආගන්තුක හමුදාවන් පිළිබඳ පනත යටතේ මෙරටට පැමිණ සිටින ආගන්තුක හමුදාවක කිසිම භටයකුට ; හෝ

(ආ) රාජකාරියෙහි යෙදී සිටින විට—

(1) පොලිස් හමුදාවේ කිසිවකුට හෝ සුරාබදු දෙපාර්තමේන්තුවේ නිලධාරියකුට ; හෝ

(2) දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවකයකුට ; හෝ

(ඇ) තැබෑරුමක් ඇතුළතදී කිසිම ස්ත්‍රියකුට ; හෝ

(ඈ) මොනම අවස්ථාවකදීවත්—

(1) වයස අවුරුදු විසිඑකට අඩු අයකුට ; හෝ

(2) සිහිවිකල වූ අයකුට ; හෝ

(3) වෙරිවී සිටින බැව් පෙනෙන හෝ වෙරිමතින් සිටිතැයි විශ්වාස කළ හැකි කෙනකුට ; හෝ

විකිණීම හෝ දීම හෝ නොකට යුතුය.

**13. බලපත්‍ර වෙන කෙනෙකුට පැවරිය නොහැකි බව, කළමනාකරුගේ පත්වීම අනුමත කළයුතු බව.**—ආණ්ඩුවේ දිසාපතිගෙන් හෝ සුරාබදු කොමසාරිස්ගෙන් හෝ කල් ඇතිව ලබා ගත් අවසරය නැති ව, මත් ද්‍රව්‍යයක් සෑදීම, සැපයීම හෝ විකිණීම පිළිබඳ කිසි ම තනි උරුමයක් නැත හොත් ඒ සම්බන්ධයෙන් ඇති යම් කිසි අයිතියක් විකිණීම, හෝ වෙන කෙනකුට පැවරීම හෝ නැවත බදුදීම හෝ නොකළ යුතුය. එසේ ම ආණ්ඩුවේ දිසාපතිගෙන් හෝ සුරා බදු කොමසාරිස්ගෙන් හෝ කලින් ලබා ගත් අනුමැතිය නැතිව, එබඳු යම් තනි උරුමයක් පාලනය කිරීම සඳහා, හෝ යම් කිසි සුරාබදු බලපත්‍රයක අනුපූරණ ගිවිසුම අත්සන් කිරීම සඳහා හෝ කිසි ම නියෝජිතයකු හෝ ඇටෝර්නි බලකාරයකු හෝ පත් නොකළ යුතුය. හැම අවස්ථාවක දී ම එකී නියෝජිතයා නොහොත් ඇටෝර්නි බලකාරයා ලංකා පුරවැසියකු විය යුතුය. තව ද ආණ්ඩුවේ දිසාපති විසින් හෝ සුරාබදු කොමසාරිස් විසින් හෝ එකී අනුමතිය දිය යුත්තේ ස්වකීය අභිමතය පරිදි විශේෂ අවස්ථාවල දී පමණකි.

**14. බලපත්‍ර ලත් ස්ථාන විවෘතකොට තැබිය යුතු බව හා ඒවායේ සෑහෙන බීම තොගයක් තිබිය යුතු බව.**—(1) 6 වැනි කොන්දේසිය හෝ 10 වැනි කොන්දේසිය හෝ යටතේ තාවකාලික වශයෙන් වසා තැබීමට අවසර දී තිබෙතොත් මිස තැබෑරුම් ද, තානායම් ද, පිට ගොස් පරිභෝග කිරීමට සිල්ලරට මත්පැන් විකුණන සාප්පු ද, රැස්ටෝරන්ට්ශාලා ද, වතු කැන්ටීම් ද, විනෝද ආපනශාලා ද, බීර හා පෝටර සාප්පු ද නියමිත කාල වේලාවල් ඇතුළත විවෘතව තැබිය යුතුවාත් හැර උචිත බලපත්‍රය යටතේ විකිණිය හැකි මත් පැන් වර්ගය නොහොත් මත් පැන් වර්ග ප්‍රදේශයේ වුවමනාවන් සඳහා ඉතා අඩු ගණනේ මෙපමණ තිබිය යුතුය කියා සුරාබදු අධිකාරි යම්කිසි ප්‍රමාණයක් නියම කරතොත් ඒ ප්‍රමාණයට මත් පැන් නොයෙකුත් හැඩයේ සිල් බෝතලවල වත්කොට හෝ වත්නොකොට හෝ බෝතල්වල වත්කොටත් නොකොටත් ඒ තැබෑරුම ඇතුළේ නිතරම තබාගත යුතු වන්නේ ය. කෙසේ නමුදු සුරාබදු කොමසාරිස් මේ අවශ්‍යතාව යම්කිසි තානායමක් හෝ විනෝද ආපන ශාලාවක් සම්බන්ධයෙන් අත් හැර දැමීමටද හැකිවේ.

(2) ආණ්ඩුවේ දිසාපති විසින් නියම කරන දිනවලදී විවෘත නොකරන තැබෑරුම් බලපත්‍රකාරයන්ගේ වගකීම පිට යලිත් මෙන්දේසි කරනු ලැබිය හැකිය.

**15. ණයට විකිණීම තහනම් බව ; විකුණන්ට බැරිය කීම.**—අත්පිට මුදලට මිස තැබෑරුම්වලදී මත් පැන් නොවිකිණිය යුතුය. මත් පැන් ගැනීමට හිමිකම් ඇති ඕනෑම කෙනකු මුදල් දී මත් පැන් ඉල්ලූවිට විකිණිය හැකි ප්‍රමාණය සීමා කරන යම්කිසි විශෙෂ කොන්දේසියක් ඇතොත් ඊට යටත්ව ඒ මත් පැන් දීමට හැම බලපත්‍රලාභියකුම බැඳී සිටිය යුතුය.

**16. මත් පැන් විකිණිය හැකි අඩුම හා වැඩිම මිල ගණන් නොඉක්මවිය යුතු බව.**—එවකට වලංගු වන නීතියේ ප්‍රකාර මත් පැන් විකිනීම සඳහා යම්කිසි අඩුම මිලක් හෝ වැඩිම මිලක් නියම කර තිබෙතොත් ඒ අඩුම මිලට අඩුවෙන් හෝ වැඩිම මිලට වැඩියෙන් හෝ කිසිම මත් පැනක් විකිණිය යුතු නොවේ.

**17. ළඟ තබාගත හැකි වැඩිම ප්‍රමාණයත් විකිණිය හැකි අඩුම ප්‍රමාණයත් නොඉක්මවිය යුතු බව**—බලපත්‍රයක් නැතිව ළඟ තබාගැනීමට නියමිත ප්‍රමාණයට වඩා මත් පැන් එකවරට එක පුද්ගලයකුට, වලංගු අවසර පත්‍රයක් නැතිව, කිසිම බලපත්‍ර ලත් ස්ථානයකින් ඉවතට ගෙන යැමට ඉඩ නොදිය යුතුය. එසේම නියමිත අඩුම ප්‍රමාණයට වඩා අඩුවෙන් කිසිම ශුදමකදී හෝ ගබඩාවකදී මත් පැන් නොවිකිණිය යුතුය.

**18. දිනපතා ගණන් හිලව් ලියා තැබීම.**—සුරාබදු කොමසාරිස් අනුමත කරන ආකාරයට ගනුදෙනු පිළිබඳ සැබෑ ගණන් හිලවු දවසින් දවස තීන්තෙන් ලියා බලපත්‍රය ලත් ස්ථානයෙහි තබාගත යුතුය. එක් එක් මාසය අවසානයේදී එකී ගණන් හිලවු නිවැරදිවත් අප්‍රමාදවත් එකතු කළ යුතුය. ගණන් හිලවු හා පාස්පත්‍ර මුද්‍රිත පොත්වල ලිවිය යුතුය. මේ පොත් මුද්‍රණය කිරීමට ගිය මුදල ගෙවූ විට හෝ ඒ මුදල ආණ්ඩුවේ භාණ්ඩාගාරයට ගෙවූ බවට කුවිතාන්සි ඉදිරිපත් කළවිට ඕනෑම කච්චේරියකින් ලබාගත හැකි ය. ලැබුණු මත් පැන් සඳහා බලපත්‍රද, නිකුත් කළ බලපත්‍රවල උප පත්‍රිකා ද බලපත්‍ර ලත් ස්ථානයෙහි (ලියුම් මිටියකට බැඳ) ගොනුකොට පරිස්සමින් තබාගත යුතුය.

පසුවට දෙන මත් පැන් වෙනුවෙන් කලින් හිස් පාස් පත්‍රිකාවක් අත්සන් කිරීම තහනම්ය. පාස්පත්‍රිකාවල උප පත්‍රිකාවත් ද රටබීම පිළිබඳ බලපත්‍ර සම්බන්ධයෙන් නම් ලැබුනු මත් පැන් සියල්ල වෙනුවෙන් ඉන්වොයිස් පත්‍රිකාවත් ද බලපත්‍රය වලංගු කාලපරිච්ඡේදය ගතවී එක් අවුරුද්දක් යනතුරු බලපත්‍රකරු විසින් සුරක්ෂිතව තබාගෙන නිලයෙන් සුරාබදු දෙපාර්තමේන්තුවේ පරීක්ෂකවරයකුට පහත් නුවූ නිලධාරියකු ඉල්ලූ විට ඉදිරිපත් කළ යුතුය. රටබීම විකිණීමට බලපත්‍ර ලත් තොග වෙළඳුන් විසින්, තොග වශයෙන් විකුණන ලද රටබීම පිළිබඳ ඉන්වොයිස් පත්‍රවල දෙවෙනි කාර්බන් පිටපත්, ඒ රටබීම තොගය විකුනූ දින සිට සත් දිනක් ඇතුළත දී ඒ ඒ කොට්ඨාශයේ සහකාර කොමසාරිස්ට යැවිය යුතුය.

ආපසු බාරදීම හෝ නිෂ්ප්‍රභාවීම හෝ කාලය ගෙවීයැම හෝ වෙන යම්කිසි හේතුවක් නිසා බලපත්‍රය අවලංගුවී දවස් තුනක් ඇතුළතදී හෝ එසේ කරන මෙන් නියම කොට දවස් තුනක් ඇතුළතදී බලපත්‍රලාභියා විසින් මේ කොන්දේසියේ විධි විධානයන් යටතේ තබාගත්තා ගණන් හිලවු පිළිබඳ සියලු පොත් පත් ද 22 වැනි කොන්දේසියේ සඳහන් පරීක්ෂන පිළිබඳ සටහන් පොතද බලපත්‍රය ලත් ස්ථානය පිහිටි ප්‍රදේශය බාර ප්‍රාදේශීය අධිකාරීට බාරදිය යුතුය.

**19. බලපත්‍රලාභීන් විසින් වාර්තා ආදිය යැවිය යුතු බව.**—බලපත්‍රකරුවන්, ඔවුන්ගේ නියෝජිතයන් හා ඒජන්තවරුන් හා සේවකයන්, යන මොවුන් හෝ ඔවුන්ගෙන් කිසිවකු ආණ්ඩුවේ දිසාපති හෝ සුරාබදු දෙපාර්තමේන්තුවේ පරීක්ෂකවරයෙකුගේ ශ්‍රේණියට නොඅඩු නිලධාරියකු ලියවිල්ලකින් නොහොත් කට වචනයෙන් ඉල්ලන ඕනෑම වාර්තාවක් හෝ තොරතුරක් නිවැරදිවත් අප්‍රමාදවත් සැපයීමට බැඳී සිටිය යුතුය.

**20. පාවිච්චි කළ යුත්තේ නොහොත් තබාගත යුත්තේ සම්මත තරාදි පඩි හා මිම් බව.**—බලපත්‍රයක් ලත් යම්කිසි ස්ථානයක පාවිච්චි කිරීම සඳහා යම් යම් තරාදි පඩි මිම් හෝ උපකරණ නියම කර ඇති විට ඒ ස්ථානයෙහි තබාගත යුත්තේ නොහොත් පාවිච්චි කළයුත්තේ ඒ නියම කරන තරාදි පඩි මිම් හා උපකරණ පමණකි. දිස්ත්‍රික්කයේ තරාදි පඩි ආදියේ මුද්දර ගසන ආයතනය ලවා ඒ තරාදි පඩි ආදිය පරීක්ෂා කරවාගෙන ඒවායේ මුද්දර ගස්සවා ගත යුතුයයි ආණ්ඩුවේ දිසාපති නියම කළොත් එසේ කරවාගත යුතුය. බලපත්‍රයක් ලත් යම්කිසි ස්ථානයක හොර තරාදි පඩි හෝ මිම් තබාගත හොත් නැත හොත් පාවිච්චි කළොත් බලපත්‍රලාභියා දඩුවම් ලැබීමට යටත් වනු ඇත.

**21. පරීක්ෂා කිරීමට බලය ලත් අය හා ඔවුන්ගේ බලතල.**—බලපත්‍ර ලත් ස්ථාන පරීක්ෂා කිරීමට බලය ලත් නිලධාරිහු නම්—

(1) ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරියකුගේ හෝ එවැනි තත්ත්වයක වෙන නිලධාරියකුගේ තත්ත්වයට පහළ නුවූද ආදායම් පිළිබඳ දෙපාර්තමේන්තුවේ වැඩ කරන්නාවූද නිලධාරිහු;

(2) සුරාබදු දෙපාර්තමේන්තුවේ පරීක්ෂකවරයකුගේ තත්ත්වයට පහත් නුවූ නිලධාරිහු; හා

(3) සුරාබදු ආඥාපනතේ 32 වැනි 34 වැනි හා 45 (අ) වැනි වගන්තිවල සඳහන් කටයුතු හා රාජකාරි ඉටුකිරීමට 7 (ඇ) වැනි වගන්තිය යටතේ පත්කරන ලද අය;

යන මොවුහු වෙති.

මේ නිලධාරීන්ට—

(අ) ස්ථානයට ඇතුල්වී සෝදිසි කර බලීමටද;

(ආ) පාවිච්චි කරන තරාදි පඩි හා මිම්ත් බලපත්‍රලාභියා ළඟ තිබෙන මත්පැන් හා මද්‍ය ඖෂධත් පරීක්ෂා කිරීමටද;

(ඇ) රසායනික විග්‍රහයක් කිරීමට හෝ තත්ත්වය හෝ සැර පිළිබඳ සැකයක් ඇති වූයෙන් පරීක්ෂා කිරීමට ඒ ස්ථානයෙන් ඒ මත්පැනෙන් හෝ මද්‍ය ඖෂධයෙන් ස්වල්පයක් සැම්පලයක් වශයෙන් ගෙන භාජනයකට දමා බලපත්‍රලාභියා ඉදිරියේදීම විධිවූ පරිදි සීල් තබා ඒ හා සමාන කොටසක් බලපත්‍රලාභියාටද දී මුදල් ගෙවීමක් නොකොට යෑමටද;

(ඈ) බීමට හෝ පාවිච්චියට නුසුදුසුයයි හෝ අතපත ගාන ලද්දේ යයි හෝ සැක කිරීමට සෑහෙන තරම් හේතු ඇති ඕනෑම මත්පැනක් හෝ ඒ ස්ථානයෙහි තිබෙන යම් මද්‍ය ඖෂධ වර්ගයක් විකිණීම නැවැත්වීමටද;

(ඉ) බලපත්‍රය ලත් ස්ථානයෙහි තබා තිබෙන ගණන් හිලවු ඉල්ලා ඒවා පරීක්ෂා කිරීමටද;

(ඊ) බලපත්‍රය ලත් ස්ථානයෙහි තිබෙන බිල් පත්‍ර, ඉන්වොයිස් හා පොත්පත් තහනම් කිරීමටද;

(උ) සුරාබදු ආඥාපනතේ විධිවිධානත් බලපත්‍රයට යාකොට ඇති කොන්දේසිත් බලපත්‍රලාභියා ලවා පිළිපැද්දවීම වශයෙන් රාජකාරිය ඉටු කිරීමට අවශ්‍ය වන සෙසු කටයුතු කිරීමටද;

බලය ඇත්තේ ය.

(බීර හා පෝටර පමණක් විකිණීමට බලපත්‍ර ලත් ස්ථානද ඇතුළු) තැබෑරුම් සම්බන්ධයෙන් වූවිට ඒ ස්ථානවල යම් පෞද්ගලික ලිපි ලේඛන හෝ පොත් පත් ආදියක් ඇතොත් ඒවා සෝදිසිකර බැලීමටද එසේ සෝදිසි කර බැලීමේදී යම් වරදක් කෙරී ඇති බවක් පෙනී ගියොත් ඒ ලිපි ලේඛන හෝ පොත් පත් ආදිය තහනම්කොට ඉවතට ගෙන යෑමටද එකී නිලධාරීන්ට බලය තිබේ.

සියලු බලපත්‍රලාභීන් විසින් ඒ නිලධාරීන් සියලු දෙනාට ඔවුන්ගේ බලතල ක්‍රියාවේ යෙදවීම සඳහා වුවමනා වන සියලු පහසුකම් හා උදවු උපකාර දිය යුතුය.

නීතියෙන් පොලිස් නිලධාරීන් කෙරෙහි පැවරී ඇති බලතල කිසිවක් මේ කොන්දේසිය නිසා නැතිවී යන්නේයයි තේරුම් නොගත යුතුය. මේ කොන්දේසිය යටතේ සැම්පල් වශයෙන් ස්ථානයෙන් පිටතට ගෙන යන මත්පැන් ආදියේ වටිනාකම පිළිබඳ වන්දියක් ඉල්ලීමට ඉඩක් නැත්තේ ය.

**22. පරීක්ෂණ සටහන් පොත.**—පරීක්ෂක නිලධාරීන් විසින් කිය යුතු කරුණු ලිවීම පිණිස බලපත්‍රලාභියා විසින්, සුරාබදු අධිකාරි දුන් පරීක්ෂණ සටහන් පොත් බලපත්‍ර ලත් ස්ථානයෙහි තබාගත යුතු වාත් හැර ඊට කුවිතාන්සියක් දුන් විට එය සුරාබදු අධිකාරිට හෝ එය බාරගැනීමට ඔහු විසින් බලය පවරන ලද වෙනයම් නිලධාරියකුට හෝ බාර දියයුතුය. බලපත්‍ර ලත් ස්ථානයෙහි ඒ සටහන් පොතක් තබා ගියොත් බලපත්‍රකරු විසින් ඊට කිසිම හානියක් වෙන්නට ඉඩ නොදී එය සුරක්ෂිතව තබාගත යුතුය.

**23. ස්වකීය සේවකයන් නියෝග උල්ලංඝනය කළොත් එය බලපත්‍රලාභීන් විසින් රපෝර්තු කළයුතු බව.**—මත්පැන් නිෂ්පාදනය කිරීම හෝ ගෙනයෑම හෝ විකිණීම සඳහා රක්ෂාවට ගෙන සිටින අය සුරාබදු නීති උල්ලංඝනය කරන බැව් තමන්ට දැනගන්ට ලැබෙන හැම අවස්ථාවකදීම ඒ බැව් සුරාබදු අධිකාරිට රපෝර්තු කිරීමටත් එබඳු අයට දිගටම රක්ෂාව දීම සම්බන්ධයෙන් අධිකාරි විසින් නිකුත් කරන ආඥාවන් පිළිපැදීමටත් බලපත්‍රලාභීහු බැඳී සිටිති. ලංකාවේ දණ්ඩනීති සංග්‍රහය යටතේ හෝ සුරාබදු ආඥාපනත යටතේ හෝ වරද කරුවෙකුවූ කිසිවකු අධිකාරි ගෙන් කලින් ලබාගත් අනුමතිය නැතිව මත්පැන් ගෙනයාම හෝ විකිණීම සඳහා රක්ෂාවට නොගත යුතුය.

**24. බලපත්‍රලාභීන් හා සුරාබදු නිලධාරීන් අතර මුදල් ගනුදෙනු කිරීම තහනම් බව.**—බලපත්‍රලාභීන් ඔවුන්ගේ නියෝජිතයන් හා ඒජන්තවරුන් හා සේවකයන් යන මොවුන් හා සුරාබදු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් අතර මොනම අන්දමේ වුවත් මුදල් ගනුදෙනුවක් කිරීම සම්පූර්ණ වශයෙන් තහනම්ය.

**25. (1) බලපත්‍ර ලත් ස්ථානයක් භාජන ආදියත් පවිත්‍රව තබාගත යුතු බව.**—බලපත්‍ර ලත් ස්ථානයත් එහි මත්පැන් වත්කර තැබීමට හෝ විකිණීමට හෝ ඒ ස්ථානයට මත්පැන් ගෙන ඊමට පාවිච්චි කරන භාජන, මිම් හා සෙසු බඩුත් හොඳටම පිරිසිදුව තබාගත යුතුය.

**(2) (කන බොන) පිඟන් කෝප්ප ආදිය සේදීම.**—පාරිභෝගිකයන්ට මත්පැන් හෝ ආහාරදීම සඳහා පාවිච්චි කරන වීදුරු මිම්, භාජන, උපකරණ යන මේ ආදී සියලු දේ පාවිච්චිකොට ආපසු දුන් වහාම පිරිසිදු වතුරෙන් සෝදා වතුර බේරියන පරිද්දෙන් හිල් සහිත රාක්කයක් උඩ මුණින් නමා තබා පිරිසිදු රෙදි කඩකින් පිස දැමිය යුතුය. බලපත්‍ර ලත් ස්ථානය වැසුවාට පසු සෑමදාම ඒ රෙදිකඩ සබන් ගා වතුරෙන් සේදිය යුතුය.

**(3) බලපත්‍ර ලත් ස්ථානයෙහි වතුර පයිප්ප ආදිය තැබිය යුතු බව.**—සුරාබදු අධිකාරි නියම කළොත් පොදු ජල සම්පාදන සේවයක් ඇති යම්කිසි නගරයක හෝ ස්ථානයක පිහිටි බලපත්‍ර ලත් මද්‍යශාලාවක ගොඩනැගිලිවල සුදුසු ලෙස වතුර පයිප්පත්, සෝදන භාජනත්, වතුර බැස යාමට කානු හෝ නළත්, ඒ මහතාගේ සිත් ගන්නා අයුරින් දම්මවා හෝ සවිකර ගත යුතුය.

**(4) කෑමට හා බීමට ගන්නා භාජන සේදීම සඳහා වතුර වත්කර තැබීමට භාජන සැපයීම.**—මේ කොන්දේසියේ (3) වැනි ඡේදය යටතේ පයිප්ප ආදිය දම්මවා ගැනීම අවශ්‍ය නොවන බලපත්‍ර ලත් හැම ස්ථානයකම පාවිච්චි කරනු ලැබූ වීදුරු, මිම්, භාජන, උපකරණ හා බඳුන් යන මේවා සියල්ල සේදීම පිණිස සෑහෙන තරම් පිරිසිදු වතුරත්, සේදූ වතුර නොහොත් ඉඳුල් වතුර වත් කිරීමට තව භාජනයක් හෝ භාජන කීපයකුත් තිබිය යුතුය. ඒ ඉඳුල් වතුර වත්කරන භාජන කලින් කල හිස් කළ යුතුය. පිරිසිදු වතුර වත්කරන භාජනය ලෝහමය භාජනයක් විය යුතුය. එහි කට භාජනයේ මහතටම තිබිය යුතුය. එහෙත් කට සම්පූර්ණයෙන්ම වැසීමට බුරුල් පියනක් තිබිය යුතුය. එපමණක්ද නොව ඒ භාජනය පතුලේ ඇබයක් (කරාමයක්) සවිකොට තිබිය යුතුයි. ඒ භාජනයෙහි ගැලොම් 4ට නොඅඩු තරම් වතුර වත්කර තැබීමට පුළුවන් විය යුතුය. පිඟන් කෝප්ප ආදිය සේදීමට වතුර ගැනීමට තරම් පහසු උස ඇති තට්ටුවක් උඩ එය තැබිය යුතුය.

(5) බලපත්‍ර ලත් ස්ථානයෙහි ස්වභාවය හා පිහිටීම අනුව ඉඩ තිබෙතොත් කුණුවතුර හෝ ඉඳුල් වතුර වක්කරන භාජනය නොහොත් භාජන වෙනුවට සේදීමට පාවිච්චි කරන වතුර පහසුවෙන් වත්කිරීමට පුළුවන් වන පරිද්දෙන් සුරාබදු අධිකාරී නියම කරන පිළිවෙළකට හුණු බදාමෙන් බැඳ උඩින් සිමෙන්ති ගා කපලාරු කරන ලද්දාවූ ද, වර්ග ප්‍රමාණයෙන් එකක්. වර්ග අඩි හතරකට අඩු නුවූද ගොඩනැගිල්ලේ පස්සා බිත්තියෙන් හෝ පැති බිත්තියෙන් හෝ වතුර පිටවී යාමට අඩු ගණනේ අඟල් දෙකකවත් විෂ්කම්භය ඇති නළ සවිකරන ලද්දාවූද වැන්කියක් නොහොත් වැන්කි කීපයක් බඳවා ගත යුතුය.

(6) කෙනෙකු පාවිච්චි කළ කිසිම වීදුරුවක් හෝ මිම්මක් හෝ භාජනයක් හෝ උපකරණයක් හෝ බඳුනක් පිරිසිදු වතුර තිබෙන කිසිම භාජනයකට සේදීම පිණිස දැමීම හෝ ගිල්ලීම හෝ නොකට යුතුය. එහෙත් ඇතුළත පිටත දෙකම හොඳින් සේදී යන පරිදි පාවිච්චි කළ ඒ වීදුරුව හෝ මිම්ම හෝ භාජනය හෝ උපකරණය හෝ බඳුන සේදිය යුත්තේ කරාමයෙන් නොහොත් ඇබය සවිකළ සිදුරෙන් වතුර වක්කිරීමට සලස්වා ඒ වතුරට ඇල්ලීමෙනි.

**26. අතිරේක පොදු නියෝග පිළිපැදිය යුතු බව.**—සුරාබදු ආඥාපනතෙන් හෝ සුරාබදු ආඥාපනත යටතේ අතිරේක පොදු නියෝග පැනවුව හොත් ඒවා පිළිපැදීමටත් ආණ්ඩුවේ දිසාපති හෝ ඔහුගෙන් බලය ලත් යම් නිලධාරියකු නියම කළොත් සංශෝධනය කිරීම පිණිස හෝ අලුත් බලපත්‍ර නිකුත් කිරීම පිණිස තමන්ගේ බලපත්‍ර ඉදිරිපත් කිරීමටත් බලපත්‍ර ලත් සියලුදෙනා බැඳී සිටිය යුතුය.

**27. බලපත්‍ර ලත් ස්ථානයක හැර වෙන ස්ථානයක මත්පැන් ආදිය විකිණීම හෝ තබාගැනීම තහනම් බව.**—(බලපත්‍ර නොලත් අය සම්බන්ධයෙන් අදාළවන නීතිය යටතේ ද ඒ නීතියට එකඟවද මිස නැත්නම්) කිසිම බලපත්‍රලාභියකු හෝ ඔහුගේ නියෝජිතයකු හෝ ඒජන්ත කෙනෙකු හෝ සේවකයකු විසින්, සුරාබදු පනතට යටත් කිසිම ද්‍රව්‍යයක් බලපත්‍රය අදාළවන ස්ථානයෙන් පිට කිසිම තැනක තබාගැනීම හෝ තබාගෙන විකිණීම හෝ තහනම්ය.

**28. විශේෂ අවසරයක් නැතිව බලපත්‍රලත් ස්ථානයෙන් පිටතට (මත්පැන් ආදිය) ගෙනයෑම තහනම් බව.**—ආණ්ඩුවේ දිසාපති ගෙන් ලබාගත් විශේෂ අවසරයක් නැතිව අරක්කු තැබෑරුමක හෝ රා තැබෑරුමක හෝ රටබීම තැබෑරුමක, බලපත්‍රලාභියා විසින් ඒ තැබෑරුමේදී විකිණිය හැකිව තිබුණ කිසිම මත්පැනක් ඒ තැබෑරුමෙන් පිටතට තමාම හෝ නියෝජිතයකු ලවා හෝ ගෙන යෑම මොනම අවස්ථාවකදීවත් නොකට යුතුය.

**29. භාජනවලට නොම්මර ගැසියයුතු බව හා ඒවායේ අල්ලන ප්‍රමාණයන් ලකුණු කළ යුතු බව, බෑල්තු මිම් තිබිය යුතු බව.**—අරක්කු රේන්දකරුගේ හැම ගබඩාවකත්, හැම අරක්කු තැබෑරුමක

හෝ රා තැබැරුමක හෝ රටබීම තැබැරුමකත්, හැම අරක්කු කැන්ටිමකත්, හැම රා කැන්ටිමකත්, හැම ඉස්කාගාරයකත්, කොයි මත් පැන් වර්ගයක් වුවත් සාදන හැම ස්ථානයකත්, තැබැරුම් විනාකිරි පෙරන ස්ථාන, ඉස්කාගාර යන මේවාට රා එකතු කරන හැම ස්ථානයකත්, විනාකිරි පෙරන හැම ස්ථානයකත්, හැම විනාකිරි ගබඩාවකත්, බීර හා පෝටර් විකුණන හැම ස්ථානයකත් හැම රෙස්ටෝරන්ට් ශාලාවකත්, හෝටලයකත්, හෝටල ආපනශාලාවකත්, මත්පැන් විකුණන හෝ බරණිවලට හෝ පීප්පවලට මත්පැන් ගබඩා කර ඇති වෙන යම් බලපත්‍ර ලත් ස්ථානයකත් මත්පැන් වත්කර තැබීමට නොහොත් ගෙන යාමට පාවිච්චි කරන හැම භාජනයකම—

(අ) අනුක්‍රමාංකයද, ගැලුම් වලින් හා ගැලුම් බාගාවලින් එහි අල්ලන යාලුම් ගණනද පැහැදිලි ලෙස පිට පැත්තේ කොටා සායම් කොට තිබිය යුතුය.

(ඉ) ඒ හැම භාජනයකටම නිවැරදි බැල්තු මිම්මක් බැගින් තිබිය යුතුය. ඒ බැල්තු මිම්ම අයිති භාජනයේ අනුක්‍රමාංකය ඒ බැල්තු මිම්මේ උඩ කෙළවරෙහි පැහැදිලි ලෙස කොටා සායම් කොටා තිබිය යුතුය. භාජනයේ අල්ලන මත්පැන් මනින්නේ ගැලුම් වලින් නම් පළමුවැනි ගැලුම වැටෙන්නේ අසවල් තැනටය, ගැලුම් බාගාවලින් නම් පළමුවැනි ගැලුම් බාගය වැටෙන්නේ අසවල් තැනටය, කියා ඒ බැල්තු මිම්මේ පළමුවැනි ඒකකය හැඟවීමට ලකුණක් ද එමෙන්ම පළමුවැනි මිනුම් ලකුණට ඉහළින් භාජනයේ අල්ලන සම්පූර්ණ මත් පැන් ප්‍රමාණය පියවනතුරු එක් එක් මිනුම් ඒකකය හැඟවීමට ලකුණුද ඒ බැල්තු මිම්මේ තිබිය යුතුය. මිනුම් ඒකකය කුමක්ද යන වග පළමුවැනි ලකුණට ඉහළින් කොටා තිබිය යුතුය.

(2) **බලපත්‍ර ලත් ස්ථානයෙහි බැල්තු මිම් තබාගත යුතු බව; පීප්පවලට එක විදියේ යතුරු දෙකක් බැගින් තිබිය යුතු බව.**—අරක්කු රේන්දකරුගේ ගබඩාවල්, අරක්කු තැබැරුම් හෝ රා තැබැරුම්, ඉස්කාගාර, කොයි මත්පැන් වර්ග වුවත් පෙරන ස්ථාන, එකතු කරන ස්ථාන, විනාකිරි පෙරන නොහොත් ගබඩා කරන ස්ථාන, බීර හා පෝටර් විකුණන ස්ථාන යන මේ හැම තැනකම එක් එක් පීප්පය නොහොත් භාජනය සඳහා සපයා ඇති බැල්තු මිම්ම බලපත්‍ර ලත් ස්ථානයෙහි කොයි විටත්, තබාගත යුතුය. එකී හැම පීප්පය කටම එක විදියේ යතුරු දෙකක් තිබිය යුතුය. ඉන් එකක් සුරාබදු අධිකාරි බාරයෙහි තිබිය යුතුය.

(3) **භාජන එහා මෙහා ගෙනයන විට බැල්තු මිම්ද ගෙන යායුතු බව.**—එකී යම් භාජනයක්, පීප්පයක් හෝ සෙසු බඳුනක් ඉවත ගෙන යන විට ඒ භාජනයට හෝ පීප්පයට හෝ බඳුනට අයිති බැල්තු මිම්මද එය ගෙනයන රථයෙන්ම ගෙන යා යුතුය.

8-275

## සුරාබදු නිවේදන අංක 502

**සුරාබදු ආඥාපනත**

### පදම්කල අරක්කු සඳහා වූ තීරු බද්ද

මුදල් ඇමතිගේ එකඟත්වය ඇතිව, කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති විසින් 1961 අංක 49 පනතින් සංශෝධිත (52 වෙනි අධිකාරය වන) සුරාබදු ආඥාපනතේ 22 වෙනි වගන්තිය යටතේ කරණු ලැබූ ආඥාව.

මෛත්‍රීපාල සේනානායක,
කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති.

1962 ජූලි මස 16 වන දින,
කොළඹදීය.

**ආඥාව**

ලංකාවේ පිහිටුවන ලද බලපත්‍රලත් යම් නිෂ්පාදනාගාරයක නිපදවනු ලැබ ඉන් නිකුත් කරනු ලබන්නාවූ පදම්කළ අරක්කු, එසේ නිකුත් කරන විට අඩංගු සැර ප්‍රමාණය අනුව, සෑම ඉම්පීරියල් ගැලුමක් වෙනුවෙන්, මෙහි පහත උපලේඛනයෙහි යොදා ඇති ගණන් අනුව 1960 අප්‍රියෙල් මස 25 වෙනි දින සිට, තීරු බද්දක් නියම කළයුතුය.

### උපලේඛනය

(ඒ) අරක්කු රේන්දකරුවන්ට රජය මගින් අරක්කු නිකුත් කිරීමේදී අඩංගු සැර ප්‍රමාණය අනුව, සාමාන්‍ය වගීයේ පීප්ප අරක්කු විකිණීමෙන් ලබාගත හැකි දළ ලාභයේ වලංගු මිලට සමාන, ලන්ඩන් සම්මත සැර ගණනකට හැරවූ ගණන; හා

(බී) පසුගිය රේන්ද වර්ෂය සඳහා දිවයිනේ පිහිටි සියලුම තැබැරුම් වෙනුවෙන් රේන්ද මුදල් (මිලදී ගත් මුදල්) වශයෙන් ගෙවන ලද සමස්තය එම රේන්ද වර්ෂය තුළදී පරිභෝග කරන ලද අරක්කු ප්‍රමාණයෙන් බෙදා, ලැබෙන නිකුත් කරන ලද සැර ප්‍රමාණයේ අරක්කු ගැලුමක රේන්ද මුදලට සමාන මුදලක්, ලන්ඩන් සම්මත සැර ප්‍රමාණයක් සඳහා වූ මුදලකට හරවා, එසේ කිරීමෙන් ලැබෙන භාජනයෙන් ශත 50 ක මුදලක් අඩුකිරීමෙන් ලැබෙන ගණන; හා

(සී) නිකුත් කරන විට අඩංගු සැර ප්‍රමාණයේ සෑම ගැලුමකට පරිපාලන ගාස්තු වශයෙන් රුපියලක මුදලක්.

8-326

**සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.**

**ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).**

**ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායක මුදල් භාරගනු නොලැබේ.**

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි